# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2353/25 – 2023 ඔක්තෝබර් මස 09 වැනි සඳුදා – 2023.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2018/57.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.02.02 දිනැති හා අංක 2317/66 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.01.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නුගේගොඩ, මිරිහාන පාර, අංක 59 හි පිහිටි ලෙකෝ නව විදුලි කාර්මික ශිල්පීන්ගේ සංගමය සහ කොළඹ 03, ගාලු පාර, 411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල හි පිහිටි ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 23/2023 හා 2023.08.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම් කිරීමේ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

ගොනු අංකය: IR/COM/02/2018/57.

ලෙකෝ නව විදුලි කාර්මික ශිල්පීන්ගේ සංගමය,
අංක 59,
මිරිහාන පාර,
නුගේගොඩ.

*පළමු පාර්ශ්වය*

එදිරිව

නඩු අංකය: ඒ/23/2023.

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල,
අංක 411,
ගාලුපාර,
කොළඹ 03.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවතින කරුණු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාගේ 2023.01.17 හා අංක IR/COM/02/2018/57 දරන ලිපියට අනුව "ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි විදුලි කාර්මික ශ්‍රේණි සඳහා පිළිවෙළින් දැනට ලබා දී ඇති E3, E5 හා E7 යන වැටුප් කේතයන්ට අදාල වැටුප් පරිමාවන් E4, E6 හා E8 ලෙස සංශෝධනය කරන ලෙස සිදු කරන ඉල්ලීම සාධාරණ හා යුක්ති සහගත ද, දැනට ලබා දී ඇති වැටුප් පරිමාවන් හේතුවෙන් විදුලි කාර්මිකයන් සඳහා අසාධාරණයක් සිදුව ඇති නම් හිමි විය යුතු සහන මොනවා ද, එම සහන හිමි විය යුත්තේ කෙදිනක සිට ක්‍රියාත්මක වන පරිදි ද" යන්න පිළිබඳ වේ. එම ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා වෙත යොමු කර ඇත.

***පෙනී සිටීම.***

***පළමු පාර්ශ්වය වෙනුවෙන්***

(I) නව විදුලි කාර්මික ශිල්පීන්ගේ සංගමයේ ලේකම් ඒ. කේ. රුවන්ගලගේ මහතා
(II) එම සංගමයේ සාමාජික ආර්. එම්. බී. එස්. ගුණතිලක මහතා
(III) නියෝජිත, සරත් රණසිංහ මහතා
(IV) සමිති සාමාජික එම්. එස්. පී. කුමාර මහතා
(V) සමිති සභාපති එම්. එයි. සුසන්ත මහතා

***දෙවන පාර්ශ්වය වෙනුවෙන්***

(I) නීති නිලධාරිණී කුෂාණි ජයසුන්දර මිය
(I) ලංකා සේවා සම්මේලනය නියෝජනය කරමින් සහකාර අධ්‍යක්ෂ ජනරාල්, නීතිඥ ඩී. එස්. දිසානායක මහතා
(III) මානව සම්පත් කළමනාකාරිණී ඩබ්. එල්. ජී. එස්. වීරසේකර මිය

නඩු විභාගයන් පැවැත් වූ දිනයන්

2023.02.13
2023.02.20
2023.02.28
2023.03.09
2023.03.22
2023.03.28
2023.04.19
2023.05.03
2023.05.09
2023.05.16
2023.05.19
2023.05.25
2023.06.01
2023.06.12
2023.06.16
2023.06.20
2023.06.28
2023.07.07
2023.07.19

2023.02.20 වන දින දෙපාර්ශ්වයම, සිය පළමු විස්තර ප්‍රකාශ කාර්මික අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදි. ඉල්ලුම්කාර පාර්ශ්වය වන ලෙකෝ නව විදුලි කාර්මික ශිල්පීන්ගේ සංගමය විසින් ඔවුන්ගේ පළමු විස්තර ප්‍රකාශයේ සඳහන්කර ඇත්තේ "1998 රැකියා ඇගයීම මත සිදු කළ බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය 2005.01.01 වන දින සිට ක්‍රියාත්මක කිරීම ආරම්භ කළත් ඒ සඳහා සකස් කළ චක්‍රලේඛය මගින් විදුලි කාර්මික ශිල්පීන් වෙත හිමි විය යුතු වැටුප් පරිමාව ලබා නොදීමෙන් අසාධාරණ හා අයුක්ති සහගත ලෙස සලකා ඇති බව කියා සිටිමි." යනුවෙනි. (පිටු අංකය 176)

මෙම ලිපියෙන් තවදුරටත් ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය කියා සිටින්නේ අනෙකුත් කාණ්ඩ වල (රියදුරන්, ආදායම් නිලධාරීන්, ලිපිකරුවන්) ලබා දුන් වැටුප් පරිමාණයන් විදුලි කාර්මික ශිල්පීන්ට ලබා දෙන වැටුප් ප්‍රමාණයන් අතර විශාල විෂමතාවයක් පවතින බවයි. (පිටු අංක 172)

එමෙන්ම "මෙම විෂමතාවය පිළිබඳව නව විදුලි කාර්මික ශිල්පීන්ගේ සංගමය දිගින් දිගටම පාලන අධිකාරියට කරුණු පැවසූ අතර ඒ හේතුවෙන් අවස්ථා ගණනාවකදීම සේවා ඇගයීම් කළ අතර ඒවාට විශාල මුදල් ප්‍රමාණයක් වැය කළ බව කියා සිටිමි" යනුවෙනි. අවසාන වශයෙන් මෙම ලිපියේ ප්‍රධාන ඉල්ලීම වී ඇත්තේ 2005 සිට 2016 දක්වා වූ වැටුප් විෂමතාවය නිවැරදි කර පැමිණිල්ලෙන් ඉල්ලා ඇති සහන ලබා දෙන ලෙසටය. එමෙන්ම 2016 සුනිල් පෙරේරා මහතා යටතේ සේවා ඇගයීමක් සිදු කර 2005 විෂමතාවය නිවැරදි කිරීමට පාලන අධිකාරියට සිදු වූ බව කියා සිටිමි යනුවෙන් සඳහන් කර ඇත. (පිටු අංකය 177)

මෙම ආයතනය විසින් පහත පරිදි ඇගයීම් හා නිර්දේශ ලබා ගැනීමට ඒ ඒ වකවානුවල කටයුතු කර ඇති බව අධිකරණයේ දී නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| 1998 | - | Temas වාර්තාව |
| 2008 | - | හොන නොපිය ලංකා සමාගමේ වාර්තාව |
| 2011 | - | චන්ද්‍රිම කරුණාචන්ද්‍ර මහතාගේ වාර්තාව |
| 2013/2014 | - | කොඩිතුවක්කු මහතාගේ වාර්තාව |
| 2015/ 2016 | - | සුනිල් පෙරේරා මහතාගේ වාර්තාව |

2018.05.02 හා ADM/EST/348 ලිපියෙන් පොදු කාර්යය මණ්ඩලයට උසස්වීම් ලබා දී මට අදාල 2005.01.11, 2005.04.04, 2012.10.02, 2013.05.03, දින දරන චක්‍රලේඛන 2016.01.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර ඇත.

Temas වාර්තාව අනුව කාර්මික ශිල්පීන් හට ඇගයීම් කර ඉහළ ලකුණු ලබා දී තිබුනද, එය නොසළකා හැර රියදුරු, කළමනාකරණ සහකාර, ආදායම් නිලධාරි යන අයට A3ශ්‍රේණියේ පිහිටුවූ අතර කාර්මික ශිල්පීන් E1 ශ්‍රේණියේ පිහිටුවීම අසාධාරණයක් බව පළමු පාර්ශ්වය සඳහන් කරයි. එහෙත් 2016.01.01 වන දින සිට ඉදිරියට E3 වැටුප් ශ්‍රේණියේ පිහිටුවා නිවැරදි කර ඇති බව වෘත්තීය සමිතිය පිළිගෙන ඇත. (පිටු අංක 77)

එමෙන්ම මෙම වෘත්තීය සමිති අදහස් කරන්නේ 2016.01.01 දින සිට නොව ADM/EST/348 2005 චක්‍රලේඛනයේ ක්‍රියාත්මක කළ දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු බවයි. ( Temas වාර්තාව පදනම් කරගෙන නිකුත් කළ චක්‍රලේඛය) කෙසේ නමුත් ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි පුද්ගලික සමාගම 2023.02.20 කාර්මික අධිකරණය වෙත දන්වා ඇත්තේ විවිධ ගැටලු හඳුනා ගැනීමෙන් පසු ඉහත චක්‍රලේඛය අවලංගු කර අංක ADM/EST/348 2007.05.02 නව චක්‍රලේඛය නිකුත් කළ බවයි. (පිටු අංක 92)

එමෙන්ම 1998.01.01 දිනෙන් පසුව බඳවා ගත් විදුලි කාර්මික ශිල්පීන් E3 වැටුප් ශ්‍රේණියේ පිහිටුවා, වැටුප් ගැලපීම් ද සිදු කර ඇති බව ඉහත ලිපියෙන් පෙන්වා දී ඇත. තවද උක්ත ලිපියෙන් මෙම ආරාවුල පිළිබඳව නව විදුලි කාර්මික ශිල්පීන්ගේ සංගමය සමාගමේ කළමනාකාරිත්වය හා කිසිදු විටෙක විධිමත් සාකාච්ඡාවක් සිදු කර නොමැති බවද උක්ත ලිපියේ සඳහන් කර ඇත.(පිටු අංක 93)

එමෙන්ම දෙවන පාර්ශ්වය සිය ලිඛිත දේශනයේ ද මානව සම්පත් කළමනාකරිණි චමිලා වීරසේකර මිය ලබා දුන් සාක්ෂිය මගින්ද මෙම කරුණ පෙන්වා දී තිබේ. එමෙන්ම, මෙම ආරාවුල පිළිබඳව යම් ප්‍රදානයක් කළහොත් එය සමාගම අර්බුදකාරී තත්ත්වයකට පත්වීමේ අවධානමක් ඇති බවද පෙන්වා දී ඇති බවද පහත සඳහන් අධිකරණයේ විභාග සටහන් මගින් ද එය පෙනී යයි. ඒ අනුව මෙවැනි ආයතන වල පාලනය තවදුරටත් රජයට තබා ගැනීමට යම් අවධානමක් ඇති විය හැකි බවට මා තමාට යෝජනා කරන බව ලංකා සේවා සම්මේලනය නියෝජනය කරමින් එහි සහකාර අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ ඩී. එස්. දිසානායක මහතා සඳහන් කර ඇත.

පි - නැහැ ස්වාමීනි ( පිටු අංක230)

2023.03.28 වන දින කාර්මික අධිකරණයේ මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දෙවන පාර්ශ්වය විසින්,

ප්‍ර - දෙවන පාර්ශ්වය විසින්, ආයතනයේ වෘත්තීය සමිති කීයක් තිබෙනවාද?

පි - දැනට 13 කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. (පිටු අංකය 235)

ප්‍ර - ඉල්ලුම්කරු සඳහන් කරපු කාර්මික ශිල්පීන් වෘත්තීය සමිති කීයක ඉන්නවාද?

පි - සමිති පහක පමණ සිටිනවා

ප්‍ර - වෘත්තීය සමිති පහම, ඒකාබද්ධ වෙලා නෙවෙයි නේද මෙම ඉල්ලීම කරන්නේ?

පි - නැහැ. (පිටු අංකය 236)

(I) දෙවන පාර්ශ්වය විසින් 2023.04.18 වන දින කාර්මික අධිකරණය වෙත දන්වා ඇත්තේ සමාගමේ මේ වන විට ලියාපදිංචි වෘත්තීය සමිති 19 ක් ඇති බවයි. (පිටු අංක 251)

(II) 2016.01.01 වන දින සිට විධායක නොවන ශ්‍රේණියේ සේවක මහත්ම මහත්මීන් වෙත ක්‍රියාත්මක වූ නව බඳවා ගැනීමේ උසස්වීමේ පටිපාටියට අනුව ඒ වන විට සේවයේ නිරත වෙමින් සිටි සේවක මහත්ම මහත්මීන්, ඔවුනට හිමි වැටුප් ශ්‍රේණි වෙත ස්ථානගත කරමින් ලිපි හා වැටුප් සංශෝධනයට නිකුත් කරන ලද ලිපි භාර නොගත් සංඛ්‍යාව 38 ක් වන අතර පසුව ඔවුන් සියලු දෙනා එකී ලිපි පිළිගනිමින් වැටුප් හිමිකම සමාගම වෙතින් ලබා ගෙන ඇත.

මෙම සමාගම විසින් පහත සඳහන් වකවානුවල සේවක මණ්ඩල ඇගයීම් කර උසස්වීම් හා ශ්‍රේණිගත කිරීම් සඳහා නිර්දේශ ඇතුළත් වාර්තා ලබා ගෙන ඇත. ඒ අනුව 1998 Teams වාර්තාවෙන් සමාගමේ සියලුම රැකියා A,E,M වශයෙන් වර්ග කර ඇත.

A - ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල තනතුරු (A1 සිට A7)
E - කාර්මික ශ්‍රේණියේ තනතුරු (E1 සිට E8)
M - විධායක ශ්‍රේණියේ තනතුරු (M1 සිට M10)

2023.02.28 දරන ලිපියෙන් ආයතනයේ මානව සම්පත් හා පරිපාලන, අතිරේක සාමාන්‍යාධිකාරි විසින් කාර්මික අධිකරණය වෙත දන්වා ඇත්තේ, 1998.01.01 සිට ඉහත, Teams වාර්තාව අනුව වැටුප් ශ්‍රේණි අතර ස්ථානගත කිරීම හා අදාල වැටුප් ශ්‍රේණිවලට බඳවා ගැනීම් හා උසස්කිරීම් පමණක් සිදු වූ බවයි.

Teams වාර්තාව අනුව තනතුරකට බඳවා ගැනීමේ ශ්‍රේණි පහත පරිදි දක්වා ඇත.

| | | |
|---|---|---|
| ලිපිකරු | - | A3 |
| රියදුරු | - | A3 |
| සැලසුම් ශිල්පී | - | E5 |
| විදුලි කාර්මික I | - | E5 |
| විදුලි කාර්මික II | - | E3 |
| විදුලි කාර්මික III | - | E1 |

මේ අනුව විදුලි කාර්මික ශිල්පීන් බඳවා ගැනීමේ 3 ශ්‍රේණියේ වැටුප් කේතය E1 වුවත්, මෙය 2016.01.01 සිට සුනිල් පෙරේරා වාර්තාව අනුව E3 වශයෙන් වෙනස් වී ඇත.

2017.05.02 හා ADM/ EST/348 ලිපියෙන් පොදු කාර්යය මණ්ඩලයට උසස්වීම් ලබා දීමට අදාල 2005.01.11, 2005.04.04, 2012.10.02 හා 2013.05.03 දින චක්‍රලේඛ 2016.01.01 සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර ඇත.

Teams වාර්තාව අනුව කාර්මික ශිල්පීන්ටහට ඇගයීම් කර ඉහළ ලකුණු ලබා දී තිබුනද? එය නොසලකා හැර රියදුරු, කළමනාකරණ සහකාර, ආදායම් නිලධාරී යන අය A3 කේතයේ පිහිටුවූ අතර, කාර්මික ශිල්පීන් E1 කෙතයේ පිහිටුවීම අසාධාරණයක් බව, ඉල්ලුම්කාර පාර්ශ්වය සඳහන් කළත් 2016.01.01 සිට ඉදිරියට E3 වැටුප් කේතයේ පිහිටුවා එය නිවැරදි කර ඇති බව ඉල්ලුම්කාර පාර්ශ්වය පිළිගෙන ඇත.( පිටු අංක 77)

එමෙන්ම ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය අදහස් කරන්නේ ADM/EST/348/2005 චක්‍රලේඛය ක්‍රියාත්මක වූ දින සිට එය ක්‍රියාත්මක විය යුතු බවයි. (Teams වාර්තාව පදනම් කරගෙන නිකුත් කළ චක්‍රලේඛය) කෙසේ වෙතත් ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි පුද්ගලික සමාගම 2023.02.20 දාතමින් කාර්මික අධිකරණය වෙත දන්වා ඇත්තේ විවිධ ගැටලු හඳුනා ගැනීමෙන් පසු ඉහත චක්‍රලේඛනය අවලංගු කර ADM/ EST/348 2017.05.02 නව චක්‍රලේඛය නිකුත් කළ බවයි. (පිටු අංක 92). එමෙන්ම 1998.01.01 දිනෙන් පසුව බඳවා ගත් කාර්මික ශිල්පීන් E3 වැටුප් ශ්‍රේණියේ පිහිටුවා, වැටුප් ගැලපීම් ද  සිදු කර ඇති බව ඉහත ලිපියෙන් පෙන්වාදී ඇත.

එමෙන්ම රියදුරු ශ්‍රේණිය සම්බන්ධ ගැටලුවද මේ වන විට නිරාකරණය කර ඇති බව එම ලිපියේ සඳහන් කර ඇත. තවද උක්ත ලිපියෙන් මෙම ආරාවුල පිළිබඳව නව විදුලි කාර්මික ශිල්පීන්ගේ සංගමය සමාගමේ කළමනාකාරිත්වය සමග කිසිදු විටෙක සාකච්ඡා කර නොමැති බව උක්ත  ලිපියේ සඳහන් කර ඇත. (පිටු අංක 93).

දෙපාර්ශ්වය විසින්ම සිය අවසාන ලිඛිත දේශන කාර්මික අධිකරණයට ඉදිරිපත් කර තිබූ අතර මෙම ආරාවුලට අදාලව දෙවන පාර්ශ්වය විසින් 2023.07.20  දාතමින් කාර්මික අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයේ සඳහන් කර ඇත්තේ ද කාර්මික ආරාවුල් පිළිබඳ පනතේ කොන්දේසි වලට පටහැනිව කටයුතු කර ඇති නිසා මෙම පැමිණිල්ල සම්පූර්ණයෙන්ම නිශ්ප්‍රභා කර ප්‍රදානයක් කළ යුතු බවටද ලිපියේ සඳහන් කර ඇත. (පිටු අංක 382).

මෙම ආරාවුලට අදාලව 2023.07.20 දාතමින් දෙවන පාර්ශ්වය ඉදිරිපත් කළ අවසාන ලිඛිත දේශනයේ සඳහන් කර ඇත්තේ කම්කරු ආරාවුල් පිළිබඳ පනතේ කොන්දේසි වලට පටහැනිව පළමු පාර්ශ්වය කටයුතු කර ඇති බව පෙනී යන හෙයින් මෙම පැමිණිල්ල සම්පූර්ණයෙන් නිශ්ප්‍රභා කළ යුතු බවයි. ( පිටු අංක 463 සිට 466) එමෙන්ම අනිවාර්ය විනිශ්චයකට යාමට පෙර හැකි පළමු අවස්ථාවේදීම සෑම උත්සාහයක්ම ගතයුතු වන්නේ ආරාවුලට අදාල සියලු පාර්ශ්වකරුවන් සාමකාමී සමථයකට පත් කිරීම බව වගඋත්තරකාර සමාගමේ අවසන් ලිඛිත දේශනයේ සඳහන් කර ඇතත්, එයට අදාලව කාර්මික අධිකරණය විසින් ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ් හි සභාපතිවරයාට මෙම අධිකරණයේ පෙනී සිටින ලෙසට දෙවතාවක් ලිඛිතව දැනුම් දුන්නද එම කැඳවීම අනුව ඔහු කාර්මික අධිකරණයට නොපැමිණි බව සඳහන් කරමි. (පිටු අංක 253) මෙම සභාපතිවරයා වෙත මා විසින් මේ සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම ආයතනයට කළ හැකි සුදුසුම කාර්යය බවට යෝජනා කර, ඒ පිළිබඳව එකඟතාවය කාර්මික අධිකරණය වෙත දැනුම් දෙන ලෙසට 2023.04.21 ලිඛිතව දැනුම් දී ඇත. එහෙත් සභාපතිවරයා එම ලිපියට පිළිතුරක් එවීමටත් උනන්දු වී නොමැති බව සඳහන් කරමි. (පිටු අංක 254) එය සමථ කටයුත්තට  බාධාවක් වූ බව සඳහන් කරමි.

එමෙන්ම මෙම ඉල්ලා ඇති වැටුප් කේතයන් E3, E5,E7 පිළිවෙළින් E4, E6, E8 වශයෙන් සංශෝධනය කිරීම අනෙක් විදුලි කාර්මික ශිල්පීන්ට බලපාන බව ඉල්ලුම්කාර පාර්ශ්වය 2023.04.19 වන දින කාර්මික අධිකරණයේදී පිළිගෙන ඇත.(පිටු අංක 258) එබැවින් මෙම සංශෝධනය අනෙක් වෘත්තීය සමිති සාමාජිකයින්ටද බලපාන බවට නිගමනය කරමි.

තවද 1998 Teams වාර්තාවේ නිර්දේශයන් නැවත බලාත්මක කිරීමට සුනිල් පෙරේරා වාර්තාව මගින් නිර්දේශ කිරීමක් හෝ අනුමැතියක් ලබා නොමැති බවට කාර්මික අධිකරණයේ දී අධිකරණය විසින් කරන ලද ප්‍රශ්න කිරීම් වලදී දෙවන පාර්ශ්වය සඳහන් කර ඇත. (පිටු අංක 241) (ඇමුණුම් A10)

තවද රට ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින මෙම අවස්ථාවේ බලශක්තියට අදාලව කටයුතු කරන ආයතනයක කාර්මික සාමය පවත්වාගෙන යැම ඉතාම අත්‍යවශ්‍ය කරුණක් බව මා පිළිගනී. තවද ආයතනයේ පැවැත්ම හා ඊට අදාල ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, ආයතනයේ කළමනාකාරිත්වය සතු වගකීමක් වේ. ඒ අනුව එවැනි ව්‍යවස්ථාපිත බලයක් මා හට ලැබී නොමැති බවද සඳහන් කරමි.

මේ සියලු කරුණු සලකා බැලීමෙන් පසු ඉල්ලුම්කාර, ලෙකෝ නව විදුලි කාර්මික ශිල්පීන්ගේ ඉල්ලීම ආයතනයේ සමස්ථ ක්‍රියාකාරිත්වයට බලපෑමක් ඇති විය හැකි හෙයින්ද, එය ආයතනයේ මීට පෙර පැවති අනුගමනය කළ ක්‍රියා පිළිවෙත් හා සලකා බැලීමේදී මෙම ඉල්ලීම බේරුම්කරණ විෂය පථය හා ගැටෙන හෙයින් ද, ඉහත නිගමන හා නිරීක්ෂණ සැලකිල්ලට ගැනීමෙන් පසු යුක්තිය හා සාධාරණත්වය පදනම් කර ගනිමින් මා විනිශ්චය අධිකාරියක් වශයෙන් මෙම ආරාවුලට අදාල සියලුම කරුණුවල සමස්ථාභාවය මෙම ප්‍රදානය කිරීමේදී මා පදනම් කරගත් බව සටහන් කරමි. ඉල්ලුම්කාර ලෙකෝ නව විදුලි කාර්මිකයන්ගේ සංගමය විසින් ඉල්ලා ඇති සහනයන් පිළිබඳව ප්‍රදානයක් කිරීමට තරම් ඉදිරිපත් කල සාක්ෂිමය කරුණු ගුණාත්මක හා ප්‍රමාණාත්මක නොවූ බවට මා නිගමනය කරමි. ඒ අනුව මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් නොකරමි.

*ප්‍රදානය*

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහළින්ම පිළිගැනෙන යුක්ති සහගත හා සාධාරණ නිගමනයක් වශයෙන්, කිසිදු ප්‍රදානයක් කිරීමට හේතු සාධක නොමැති බැවින් එවැනි නිගමනයන්ට, නොඑළඹීමෙන් මෙම අයදුම්පත ප්‍රතික්ෂේප කරමි.

**ඒ. බී. හේරත්,**
බේරුම්කරු

2023 අගෝස්තු මස 31 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

10 – 0106

---

මගේ අංකය: IR/COM/04/2020/144.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.09.28 දිනැති හා අංක 2299/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2022.09.09 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කටුවන, බූකැන්ද යාය, කාවින්දි, 45/5ඒ හි පදිංචි ජේ. එච්. සිසිර සමන්කුමාර මයා සහ කොළඹ 15, රොක් හවුස් පටුමග හි පිහිටි ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 53/2022 හා 2023.09.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදී ය.

නඩු අංකය : ඒ53.2022
IR/COM/04/2020/144

ජේ.එච්. සිසිර සමන් කුමාර,
45/50 ඒ,
"කාවින්දි",
බූකැන්දයාය, කටුවන

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
රොක්හවුස් පටුමග,
කොළඹ 15

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම බේරුම්කරු වශයෙන් මා පත්කර ඇත.

ඉහත පැමිණිලිකාර පළමු වන පාර්ශ්වය සහ වගඋත්තරකාර දෙවන පාර්ශ්වය අතර ඇති වී ඇති ආරාවුල හේතු වී ඇති කරුණු කම්කරු කොමසාරිස් ජනරාල් වරයා විසින් 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් පරිදි බේරුම්කරු වෙත දැනුම් දී ඇත.

" ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවයේ නියුතු ජේ. එච්. සිසිර සමන් කුමාර මයා හට ගබඩා භාරකරු අධි ශ්‍රේණිය 1 වන JM1- 1 ශ්‍රේණිය තනතුර හිමිනම් ඒ කවරදාක සිටද, එසේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

ඒ අනුව කාර්මික ආරාවුල් පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 1959 පෙබරවාරි මස 25 වන දින පනවා ඇති නියෝග අංක 21 යටතේ ආරාවුලට අදාල පාර්ශ්වයන් වෙතින් කැඳවන ලද ආරාවුලට විෂය වී ඇති කාරණා සම්බන්ධයෙන් තමන්ට කියා සිටිමට ඇති කරුණු පිළිබඳ ලිඛිත ප්‍රකාශයන් සහ ප්‍රතිඋත්තර ප්‍රකාශයන් ද ලබා ගෙන මූලික සාක්ෂි විභාගය ආරම්භ කර බේරුම්කරණ කටයුතු ඉදිරියට ගෙන ගියෙමි.

පැමිණිල්ල වෙනුවෙන් පැමිණිලිකරුගෙන් මූලික සාක්ෂි ලබා ගැනීම 2022.10.22 දින සිට 2022.12.06 වන දින දක්වා සිදුකර අවසන් කරන ලදි. අනතුරුව පැමිණිලි පාර්ශ්වය වෙනුවෙන් පළමු සාක්ෂිකරු වශයෙන් සාක්ෂි ලබා දුන් ලසන්ත ධම්මික ගුණසිංහ වෙල්ලප්පුලි යන අයගේ සාක්ෂි ලබා ගැනීම 2023.01.05 දින සිට 2023.02.14 වන දින දක්වා සිදු කර අවසන් කිරිමට යෙදුනි. පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ලබාදුන් දෙවන සාක්ෂිකරු වන කේ. එම්. එන්.ආර්. දිසානායක ගෙන් සාක්ෂි ලබාගැනීම සිදු කරමින් පවතිද්දි එම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නියමිතව තිබූ 2023.02.28 වන දින වගඋත්තරකාර පාර්ශ්වය විසින් බේරුම්කරණ කටයුතු ආරම්භයේදීම කියා සිටියේ තම පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරිය මෙම නඩුවෙන් ඉවත් වීමට තීරණය කරඇති බැවින් අද දින හරස් ප්‍රශ්න ඇසීමට හැකියාවක් නොමැති බවයි.

වග උත්තරකාර ආයතනය නියෝජනය කරමින් මෙම නඩුව වෙනුවෙන් මුල සිටම ඉදිරිපත්ව සිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ (වගඋත්තරකාර ආයතනයේ) නීති නිළධාරිණිය වන නීතිඥ නයනා කුමාරි කරුණාරත්න මහත්මිය මෙදින ද පැමිණ සිටි අතර ඇයට පැමිණිලි පාර්ශ්වයේ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට හැකියාව තිබියදී එය පැහැර හරින ලද බව නිරීක්ෂණය කළෙමි.

තවද මෙදින වගඋත්තරකාර පාර්ශ්වය දන්වා සිටියේ තම පාර්ශ්වය පැමිණිලිකාර පාර්ශ්වය සමඟ මෙම ආරාවුල පිළිබඳ සමථයක් ඇති කර ගැනීම සඳහා දැනට සාකච්ඡා පවත්වමින් සිටින බවකි.

දෙපාර්ශ්වය අතර සමථයක් ඇති කර ගැනීම සඳහා සාකච්ඡා කර කඩිනමින් තම තීරණය බේරුම්කරු වෙත දැන්වීමට කටයුතු කරන ලෙසත් මේ අයුරින් දිගින් දිගටම කල් යැවීමට සූදානම් නොවිය යුතු බවත් සමථයක් සඳහා දෙපාර්ශ්වය අතර සාකච්ඡා ඉදිරියට

පවත්වාගෙන යන අතරතුර බේරුම්කරණ කටයුතු ද ඉදිරියට පවත්වාගෙන යායුතු බවත් දෙපාර්ශ්වය වෙත පැහැදිලි කර දුනිමි. වගඋත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර සිටින පරිදි දෙපාර්ශ්වය අතර සමථයක් ඇති කර ගැනීමට හැකි වන්නේ නම් එම සමථය මත පිහිටා පැමිණිලිකාර පාර්ශ්වය විසින් පැමිණිල්ල ඉල්ලා අස්කර ගතයුතු බවත් ඒ අනුව නඩුව අවසන් කළහැකි බවත් පෙන්වා දුනිමි.

එසේ නැතිව දෙපාර්ශ්වය විසින් සාකච්ඡා කර අවසන් සමථයකින් තොරව යම් එකඟතාවයන්ට පමනක් පත්වීම සිදුව ඇත්නම් එම එකඟතාවයන් පිළිබඳව සාක්ෂි විභාගයේදී හෝ නොඑසේ නම් ලිඛිතව දැන්වීමෙන් හෝ පසුව එම එකඟතාවයන් ද සලකා බලා අවසානයේ දී සුදුසු ප්‍රදානයක් ලබා දීමට ක්‍රියා කළහැකි බවද පෙන්වා දුනිමි.

ඒ අනුව නැවත විභාගය 2023.03.13 දිනට නියම කර 2023.02.28 දිනට බේරුම්කරණ කටයුතු අවසන් කළෙමි. නමුත් 2023.03.13 දිනට නඩු විභාගය නොපැවැත්වූ බැවින් ඊළඟ දිනය ලෙස 2023.03.20 දිනට තීරණය කරන ලදි.

2023.03.20 වන දින පැමිණිලි පාර්ශ්වය වෙනුවෙන් දැනට සාක්ෂි ලබා දෙමින් සිටින කේ.එම්.එන්.ආර්.දිසානායක මහතාගෙන් හරස් ප්‍රශ්න ඇසීමටත් වගඋත්තරකාර පාර්ශ්වයේ මූලික සාක්ෂි විභාගය ආරම්භ කිරීමටත් දෙපාර්ශ්වය විසින් කලින් දින එනම් 2023.02.28 දින එකඟතාවය පළකර තිබුනි. එබැවින් 2023.03.20 වෙනි දින වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතීඥවරියක පෙනී සිටි නමුත් වග උත්තරකාර ආයතනය නියෝජනය කරමින් පෙනී සිටියේ ප්‍රධාන ලිපිකරුවෙකු ලෙස හඳුන්වා ගත් වගඋත්තරකාර ආයතනයේ ලිපිකාරිණියකි. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වැනි ආයතනයක් වෙනුවෙන් සාක්ෂි ලබා දීමට එම සංස්ථාවේ සභාපති, අධ්‍යක්ෂවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කළමණාකරුවෙකු වැනි වගකිවයුතු නිළධාරියෙකු විසින් කළයුතු කාර්යයක් බවත් ලිපිකාරිණියකට මෙවැනි ආයතනයක් වෙනුවෙන් තීරණ ගැනීමට හැකියාවක් නොමැති බවත් ආයතනය විසින් ගෙන ඇති පරිපාලන තීරණ පිළිබඳ ඇයට පැහැදිලි කිරීමක් කිරීමට හැකියාවක් හෝ නිසි අවබෝධයක් නොමැති බවත් පෙන්වා දුනිමි.

මේ අනුව පෙනී යන්නේ වගඋත්තරකාර ආයතනය විසින් මෙම බේරුම්කරණ කටයුතු හිතාමතාම අඩාල කිරීමටත් අවතක්සේරු කිරීමටත් ක්‍රියා කරන බවකි. තවද මෙදින පැමිණිලිකාර පාර්ශ්වයේ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නියමිතව තිබුන ද මෙදින ඔහු පැමිණ නැත. හරස් ප්‍රශ්න වලට මුහුණ දීම මග හැරීමෙන් තම සාක්ෂියේ විශ්වාසනියත්වය හීනවිය හැකි බැවින් එම තත්වය පැමිණිලිකාර පාර්ශ්වය විසින් දරාගත යුතුව ඇති බව පැමිණිලිකාර පාර්ශ්වයට පැහැදිලි කර දුනිමි.

මෙම සාක්ෂි විභාගය පැවැත්වූ පෙර දින එනම් 2023.02.28 වන දින සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට තිබූ අවස්ථාව පැහැර හැරිය නමුත් අද දින පැමිණිලිකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දෙමින් සිටි සාක්ෂිකරු පැමිණ නොමැති තත්ත්වයක් යටතේ තමන් හරස් ප්‍රශ්න ඇසීමට සූදානම් බව වගඋත්තරකාර පාර්ශ්වය කියා සිටී. සාක්ෂිකරු නොමැතිව හරස් ප්‍රශ්න ඇසීමට නොහැකි බවත් වග උත්තරකාර පාර්ශ්වයේ මූලික සාක්ෂි ලබා දීම සඳහා අද දිනට නියම කර තිබූ බැවින් වගඋත්තරකාර පාර්ශ්වය විසින් වගකිව යුතු නිළධාරියෙකු ඉදිරිපත් නොකිරීම නිසා අද දින (2023.03.20) එම කාර්යයද කළ නොහැකි බව පෙන්වා දුනිමි.

අනතුරුව වගඋත්තරකාර පාර්ශ්වයේ නීතීඥවරිය විසින් ප්‍රකාශයක් කරමින් කියා සිටියේ වගඋත්තරකාර පාර්ශ්වය හා පැමිණිලිකාර පාර්ශ්වය අතර මෙම ආරවුල සමථයකට පත් කර ගැනීමට කටයුතු කර ඇති බවත් ඊට අදාලව කම්කරු දෙපාර්තමේන්තුවේ බේරුම්කරණ අංශයේ සහකාර කම්කරු කොමසාරිස් අමතන ලද ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සාමාන්‍යාධිකාරිගේ අංක CFHC/HR.2023/371-1 හා 2023.03.15 දිනැති ලිපිය ඉදිරිපත් කරමින් එය X1 ලෙස සලකුණු කිරීමට අවසර ඉල්ලා සිටින බවයි. ඊට අවසර ලැබිණ. එම ලිපියේ දැක්වෙන්නේ පැමිණිලිකරු ඉල්ලා සිටින තනතුරු වග උත්තරකරු විසින් යෝජනා කරන ලද දිනක සිට ක්‍රියාත්මක වන පරිදි පැමිණිලිකරුට ලබා දී එම තනතුරු වල පිහිටු වීමට කරන ලද යෝජනාවට දෙපාර්ශ්වය විසින් එකඟතාවයකට පත්ව ඇති බවත් ඒ අනුව ආරාවුල සමථයකට පත්කර ගැනීමට තීරණය කර ඇති බවත්ය.

පැමිණිලිකාර පාර්ශ්වය විසින් අද දින ඊට ප්‍රතිචාර දක්වමින් කියා සිටින්නේ ඉහත සඳහන් වගඋත්තරකාර ආයතනය විසින් යෝජනා කරනු ලබන තනතුරුවලට පත් කිරීම පමනක් නොව ඒ සඳහා ලැබිය යුතු හිඟ වැටුප් ද නිවැරදිව ගණනය කර ගෙවිය යුතු බවත් එම හිඟ වැටුප් මුදල් 2023.04.03 දිනට පෙර තමා වෙත ගෙවා නිම කළ යුතු බවත් එසේ නොවන්නේ නම් වගඋත්තරකාර පාර්ශ්වය සමඟ කිසිදු සමථයකට පත් වීමට තමන් එකඟ නොවන බවයි.

කෙසේ නමුත් අද දිනද සාක්ෂි විභාගය පැවැත්වීමට නොහැකි විය. දෙවන පාර්ශ්වය හිතාමතා බේරුම්කරණ කටයුතු අඩාල කරමින් කල් ලබා ගන්නා බවත් නිරීක්ෂණය වන බැවින් 2023.04.03 දිනට දෙපාර්ශ්වය අතර සමථයක් ඇති කර ගෙන පැමිණිලි පාර්ශ්වය විසින් පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීම හෝ බේරුම්කරණ කටයුතු ඉදිරියට පවත්වාගෙන යනු ලැබීමට කටයුතු කරන ලෙසට දෙපාර්ශ්වයටම අවවාද කළෙමි. ඒ අනුව නැවත විභාගය 2023.04.03 වන දිනට නියම කරන ලදි.

2023.04.03 දින සාක්ෂි විභාගය සඳහා දෙපාර්ශ්වයම පෙනී සිටි අතර පැමිණිලිකාර පළමු පාර්ශ්වය කියා සිටින්නේ තමන් වගඋත්තරකාර පාර්ශ්වය සමඟ සමථයක් ඇති කර ගැනීමට එකඟතාවය පළකළ නමුත් වග උත්තරකාර පාර්ශ්වය විසින් පැමිණිලිකරුට ලැබිය යුතු හිඟ වැටුප් මුදල් ගෙවීම සම්බන්ධයෙන් මෙතෙක් අවසන් තීරණයකට පැමිණි නැති බැවින් දෙපාර්ශ්වය අතර සමථයක් ඇති කර ගැනීමේ කටයුතු පමා වී ඇති බවයි.

මේ අයුරින් දිගින් දිගටම බේරුම් කරණ ක්‍රියාවලිය වග උත්තරකාර පාර්ශ්වය විසින් ප්‍රමාද වන අයුරින් කටයුතු කරන්නේ නම් 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 39 වන වගන්තියට අනුව අමාත්‍යවරයා විසින් 1959 පෙබරවාරි 25 දින පනවන ලද නියෝග අංක 28 අනුව සාක්ෂි විභාගය පැහැරහැරීම නොතකා බේරුම් කරණ කටයුතු ඉදිරියට ගෙන යාමට තීරණය කරන බව දෙපාර්ශ්වය වෙත දැන්වීය.

මෙහිදි වගඋත්තරකාර පාර්ශ්වය විසින් පැමිණිලිකාර පාර්ශ්වයේද එකගතාවයෙන් ඉල්ලා සිටියේ නඩුවේ සාක්ෂි විභාගය මෙතැන් සිට නතර කර දෙපාර්ශ්වයේ ලිඛිත දේශන වලට අවස්ථාව සලසා දී සුදුසු ප්‍රදානයක් ලබා දෙන ලෙසයි. ඒ අනුව 2023.04.28 දිනට ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට දෙපාර්ශ්වය එකග වූ බැවින් එදිනට ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට නියම කළෙමි. ඒ අනුව ප්‍රදානයක් ලබා දීමට 2023.05.08 දිනට හැකිවනු ඇති බවද දන්වා සිටියෙමි.

පැමිණිලිකාර පාර්ශ්වය විසින් තමන්ගේ ලිඛිත දේශනය 2023.04.20 දින ලබා දී ඇති නමුත් වගඋත්තරකාර පාර්ශ්වය 2023.04.28 දින දක්වා නිහඬව සිට ඇත. එබැවින් 2023.05.03 දින බේරුම්කරුගේ නියමයෙන් වගඋත්තරකාර පාර්ශ්වය වෙත 2023.05.04 දාතමින් ලිඛිතව දන්වා යවා ඇත්තේ 2023.04.28 දිනට ලබා දීමට නියමිතව තිබූ ලිඛිත දේශන මෙතෙක් ලබා දී නැති බැවින් එදින සිට දින 14 ක් ඇතුළත එම ලිඛිත දේශන ලබා දිය යුතු බවත් එසේ ලබා දීමට තමන් අපොහොසත් වන්නේ නම් වගඋත්තරකාර පාර්ශ්වයේ ලිඛිත දේශන නොසළකා හරිමින් ප්‍රදානයක් ලබා දීමට පියවර ගැනීමට සිදු වන බවයි.

ඊට ප්‍රතිචාර දක්වමින් වගඋත්තරකාර ආයතනයේ නීති නිළධාරිණිය විසින් 2023.05.11 වෙනි දිනැති මෝසම් පත්‍රයක් මගින් දන්වා ඇත්තේ,

I. දෙපාර්ශ්වයේ සමථ කොන්දේසි අනුව පැමිණිලිකරු වෙත අයවිය යුතු හිඟ වැටුප් ගෙවා ඇති බවත්

II. ඒ අනුව නඩුව අවසන් කිරීමට එකග වන බව දන්වමින් බේරුම්කරණයට මෝසමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව පැමිණිලිකාර පාර්ශ්වය විසින් තමන්ට දන්වා ඇති බවත්ය.

නමුත් පැමිණිලිකාර පාර්ශ්වය විසින් එවැනි මෝසමක් ගොනු කර නොමැති බැවින් 2023.05.15 දිනැති ලිපිය මගින් දෙපාර්ශ්වය 2023.05.26 දිනට යළි කැඳවීමට පියවර ගතිමි. වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති 2023.05.11 වෙනි දිනැති මෝසම් පත්‍රය ප්‍රකාරව යම් සමථයක් දෙපාර්ශ්වය අතර ඇති වී ඇත් ද යන්න පරීක්ෂා කර බැලීමට මේ අයුරින් දෙපාර්ශ්වය මෙදිනට කැඳවීමට තීරණය කළෙමි.

2023.05.26 වන දින දෙපාර්ශ්වය බේරුම්කරු ඉදිරියේ පෙනී සිටි අතර පැමිණිලිකාර පාර්ශ්වය විසින් 2023.05.17 දිනැති පැමිණිලිකරුගේ ලිපියක් ඉදිරිපත් කරමින් කියා සිටියේ වගඋත්තරකාර ආයතනය තමා සමග එකග වූ කොන්දේසි නිසි පරිදි ඉටු නොකිරීම නිසා වගඋත්තරකාර ආයතනය සමග කිසිදු සමථයක් ඇති කර ගැනීමට නොහැකි වී ඇති බවයි.

එම කොන්දේසි වනුයේ,

I. ලැබිය යුතු වැටුප් වර්ධක 06ක් ලබා නොදීම.
II. හිඟ වැටුප් ගණනය කරන ලද ආකාරය ඉදිරිපත් නොකිරීම.
III. ලබාදුන් මූලික වැටුප අප්‍රේල් මස මූලික වැටුපට හෝ මේ වන තෙක් ලබා නොදීම.
IV. හිඟ වැටුප් මුදලෙන් සේවක අර්ථ සාධක අරමුදලේ සේවකයාගේ දායක කොටස ලෙස අඩුකරගත් මුදල මේ දක්වා අර්ථ සාධක අරමුදලට නොයැවීම.
V. 2023.02.12 වන දිනට වැඩි විය යුතු වැටුප් වර්ධකය මේ වන තෙක් ලබා දීමට කටයුතු නොකිරීම.

තවද මෙදින වගඋත්තරකාර පාර්ශ්වය විසින් කියා සිටියේ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව කරන ලද යොමු කිරීමට අදාලව සියලු කරුණු ඉටු කර ඇති බැවින් බේරුම්කරුට තවදුරටත් මෙම නඩුව පවත්වාගෙන යා නොහැකි බවයි. නමුත් කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රකාශයට අනුව තමන් විසින් ඉටු කරන ලද දේ පිළිබඳ සවිස්තර කරුණු දැක්වීමක් වගඋත්තරකාර පාර්ශ්වය විසින් නොකරන ලදි.

වගඋත්තරකාර පාර්ශ්වය විසින් පැමිණිලි පාර්ශ්වය වෙනුවෙන් ආරවුල සමථයකට පත් කර ගැනීම සඳහා සියලු කරුණු ඉටු කර ඇති බව කියමින් බේරුම්කරණ ක්‍රියාවලියේ සාක්ෂි විභාගය ඉදිරියට ගෙන යාමට අකමැත්ත ප්‍රකාශ කරන නිසාත් මීට ප්‍රථම දිනයන්හි දී ද සාක්ෂි විභාගය ඉදිරියට ගෙන යෑම දිගින් දිගටම මගහැර ඇති නිසාත් 2023.04.03 දින දෙපාර්ශ්වය විසින් එකග වූ පරිදි සාක්ෂි විභාගය මෙතෙකින් නතර කොට ලැබී ඇති සාක්ෂි හා ලිඛිත දේශන පදනම් කරගෙන සුදුසු ප්‍රදානයක් ලබා දෙන ලෙස කරන ඉල්ලීම අනුව කටයුතු කිරීමට සිදු වන බව දෙපාර්ශ්වයට පැහැදිලි කර දුනිමි.

ඒ අනුව වගඋත්තරකාර පාර්ශ්වයට ලිඛිත දේශන ඉදිරිපත් කිරීම සඳහා නැවතත් කාලය ලබාදිය හැකි බවත් අවසාන වශයෙන් 2023.06.09 දිනට හෝ එදිනට පෙර තම ලිඛිත දේශන ඉදිරිපත් කළහැකි බවත් දන්වා සිටයෙමි.

2023.06.09 දින වගඋත්තරකාර පාර්ශ්වයේ ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට යෙදුනි.

වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනය සමඟ X1, X2a, X2b, X2a1, X2b1, X3 නමැති ලේඛනද ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කර ඇත. X2a, X2a1, X2b, X2b1, X3 යන ලේඛන සාක්ෂි විභාගයේදී සළකුණු නොකරන ලද ලේඛන බැවින් එම ලේඛන පිළිබඳව පැමිණිලිකාර පාර්ශ්වයට ප්‍රශ්න කිරීමට අවස්ථාවක් ලැබී නැත. එබැවින් එම ලේඛන පිළිබඳ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් ගැටලු සහගත වේ. එබැවින් එම තීරණ ගැනීම සඳහා එම ලේඛන පදනම් කර නොගන්නා ලදි. බේරුම්කරු වෙත වගඋත්තරකාර පාර්ශ්වය විසින් එවා ඇති ලිපියක් වගඋත්තරකාර පාර්ශ්වය විසින් X1 ලෙස ලකුණු කර ඇති නමුත් වගඋත්තරකාර පාර්ශවයේ ලිඛිත ප්‍රකාශය සමඟ X1 ලෙස ඉදිරිපත් කර ඇත්තේ සාක්ෂි විභාගයේ දී ලකුණු නොකරන ලද පැමිණිලිකරු විසින් වගඋත්තරකරුට යවන ලද ලිපියකි. එයද සළකා බැලීම ප්‍රතික්ෂේප කළෙමි.

පැමිණිලි කර පාර්ශ්වයද X1, Y1, Y2, Y3, Y4 ලෙස වූ ලේඛන කිහිපයක් තම ලිඛිත දේශනය සමඟ ඉදිරිපත් කර ඇත. X1 ලෙස ඉදිරිපත් කර ඇති 2023.03.20 දින වගඋත්තරකාර පාර්ශ්වය විසින් බේරුම්කරණයේදී ලකුණු කරන ලද ලේඛනය වේ. එම ලේඛනය පිළිගනිමි. Y1, Y2, Y3, Y4 යනුවෙන් ලකුණු නොකරන ලද ලේඛන හතර අවිධිමත් දිවුරුම් ප්‍රකාශයක් සමඟ ඉදිරිපත් කර ඇත. දිවුරුම් ප්‍රකාශයේ ප්‍රතිඥා ලබා දීම සඳහන්ව නැත. එම ලේඛන ද සළකා බැලීම ප්‍රතික්ෂේප කළෙමි.

වගඋත්තරකාර පාර්ශ්වය ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයේ 1.3 ඡේදයේ සඳහන් කර ඇත්තේ තම පාර්ශවයේ හරස් ප්‍රශ්න වලට භාජනය කිරීමට ඉඩ නොදී ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුගේ නඩුව අවසන් කළද වගඋත්තරකරුගේ නඩුව ආරම්භ කර නොමැති බවයි. තවද ඊට හේතුව සමථයකට එළඹීමට දෙපාර්ශ්වය දක්වන ලද කැමැත්ත බව ද වගඋත්තරකාර පාර්ශ්වය විසින් තම ලිඛිත දේශනයේ සඳහන් කර ඇත. 2023.02.28 දින හරස් ප්‍රශ්න ඇසීමට නියමිතව තිබුනු අතර පැමිණිලිකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දෙමින් සිටි සාක්ෂිකරු එදින පැමිණ සිටි නමුත් වග උත්තරකාර පාර්ශ්වය හරස් ප්‍රශ්න ඇසීම මගහැර ඇත.

සාක්ෂි විභාගයද මග හරිමින් සමථයක් සඳහා ක්‍රියාත්මක වීමට වගඋත්තරකාර පාර්ශ්වය දිගින් දිගටම අසමත් වීම හේතුවෙන් බේරුම්කරණ ක්‍රියාවලියද දිගින් දිගටම ප්‍රමාද වෙමින් පැවතුනි. ඒ අනුව 2023.04.03 දින දෙපාර්ශ්වය විසින් එක්ව කරන ලද ඉල්ලීම පරිදි සාක්ෂි විභාගය මෙපමණකින් නවතා ලිඛිත දේශන කැඳවීමෙන් අනතුරුව සුදුසු ප්‍රදානයක් ලබා දීමට තීරණය කළෙමි. 2023.04.03 දින සාක්ෂි සටහන් නිරීක්ෂණයේදී ඒ බැව් තහවුරු වේ.

එදින නඩුවේ සාක්ෂි සටහන් වගඋත්තරකාර පාර්ශ්වයට ලබා ගත හැකිව තිබූ අතර ඒ පිළිබඳ නිවැරදි කිරීමක් කරන ලෙස මේ දක්වා ඉල්ලීමක් කර නැත. නමුත් වගඋත්තරකරුගේ ලිඛිත දේශනයේ 3.7, 3.10, 3.12, 3.15, ඡේදවල පුන පුනා ප්‍රකාශ කර ඇත්තේ බේරුම්කරු විසින් වගඋත්තරකරුගේ නඩුව ආරම්භ කිරීමට අවස්ථාවක් නොදුන් බවයි. එය සාවද්‍ය ප්‍රකාශයකි. ඒ හැර 2023.02.28 දින සිට 2023.04.03 දක්වා වූ බේරුම්කරණ ක්‍රියාවලියේ දී සාක්ෂි විභාග කිරීම සඳහා ගත් සියලු උත්සාහයන් ව්‍යවර්ථ කිරීමට වගඋත්තරකාර පාර්ශ්වය විසින් ක්‍රියාකර ඇති බව සාක්ෂි සටහන් පරික්ෂා කිරීමේදී පැහැදිලි වේ.

තවද 2023.03.20 දින බේරුම්කරු විසින් දෙපාර්ශ්වය අතර ඇති වී ඇති සමථය නොසලකා බේරුම්කරණ කටයුතු ඉදිරියට ගෙන යාමට තීරණය කර ඇති බව වගඋත්තරකරුගේ ලිඛිත දේශනයේ 3.5 ඡේදයෙන් කියා සිටි. එදින සිදු කර ඇත්තේ දෙපාර්ශ්වය අතර සමථයක් සඳහා එකඟතාවයක් ඇති කර ගෙන ඇති බවට ඉදිරිපත් කරන ලද X1 ලේඛනයේ සඳහන් සමථ කොන්දේසි මෙතෙක් ඉටුකර නැති බවට පැමිණිලිකාර පාර්ශ්වය කරනු ලබන ප්‍රකාශය අනුව දෙපාර්ශ්වය තවදුරටත් සාකච්ඡා කර අවසන් සමථයකට පත්වනවාද එසේ නැතහොත් බේරුම්කරණ කටයුතු ඉදිරියට ගෙන යනවාද යන්න තීරණය කිරීමට 2023.04.03 වන දිනට නැවත දින නියම කිරීමයි. එසේ කිරීමට හේතු වූයේ එදින වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් මූලික සාක්ෂි ලබා දීම ආරම්භ කිරීමට සුදුසු වගකිව යුතු නිළධාරියෙකු පැමිණ නොසිටීමයි. ඒ බැව් එදින වගඋත්තරකාර පාර්ශ්වයට පැහැදිලි කර දුනිමි. එදින බේරුම්කරු විසින් කරන ලද ප්‍රකාශය එදින නඩුවේ සටහන් පරික්ෂා කිරීමේදී පෙනී යයි.

“වගඋත්තරකාර ආයතනය වන ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙනුවෙන් අද දින පෙනී සිටින්නේ ප්‍රධාන ලිපිකරුවෙකු වන ගල්බොක්ක හේවගේ නිල්මිණි දමයන්ති සිල්වා මහත්මියයි. මෙම බේරුම්කරණ කටයුතු ඉදිරියට ගෙන යාමට ඇයගේ දායකත්වය ප්‍රමාණවත් නොවන බවත් වගකිවයුතු නිළධාරියෙකු ඉදිරිපත් කිරිම වගඋත්තරකාර පාර්ශ්වයේ වගකීමක් බවත් මම තීරණය කරමි. අවසාන වශයෙන් දෙපාර්ශවයේ එකඟතාවය මත මෙම බේරුම්කරණය ඉදිරියට ගෙන යාම පිළිබඳ තීරණයක් ගැනීමට දිනයක් අයැද සිටී. ඒ අනුව මෙම නඩුව 2023.04.03 වන දින පෙ.ව. 10.00 ට කැඳවීමට නියම කරමි.”

(2023.03.20 නඩුවේ සටහන් පිටු අංක ෘ 02)

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 17 වන වගන්තියෙන් බේරුම්කරු වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව සාක්ෂි විභාගය අවසන් කිරීමෙන් පසුව ලබා ගෙන ඇති ලිඛිත හා වාචික සාක්ෂි විශ්ලේෂණය කරමින් බේරුම්කරුගේ තීරණය සහ එම තීරණයට එළඹීමට හේතු පැහැදිලි කිරීමට පෙර විසඳා තීරණයකට එළඹීම සඳහා අවශ්‍ය ප්‍රශ්න හතරක් හඳුනා ගනිමි.

1. පැමිණිලිකරු මේ දක්වා සැබෑ ලෙසම සේවයේ යොදවා සිටි කනතුර හෝ තනතුරු මොනවාද,
2. පැමිණිලිකරුගේ උසස්වීම් සම්බන්ධයෙන් අදාල වන උසස්වීම් පටිපාටියක් ආයතනය තුළ තිබුනේද,
3. එම උසස්වීම් පටිපාටියට අනුව ගබඩාභාරකරු අධිශ්‍රේණිය I තනතුරට උසස්වීමට හිමිකම ලබා තිබුනේද සහ එම තනතුරට හිමි වැටුප් කාණ්ඩය JM1 - 1 වන්නේද, එම තනතුරට හිමිකම් ලබන්නේ නම් ඒ කවදා සිටද,
4. එසේ එම තනතුරට සහ එම වැටුප් කාණ්ඩයේ වැටුපකට හිමිකම් ලබන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද?

**පැමිණිලිකරු මේ දක්වා සැබෑ ලෙසම සේවයේ යොදවා සිටි තනතුර හෝ තනතුරු මොනවාද?**

වගඋත්තරකාර පාර්ශ්වය විසින් යන්ත්‍ර ශිල්පියෙකු වශයෙන් අවුරුදු එකක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ 1998.07.22 දිනැති ලිපිය මගින් පැමිණිලිකරු 1998.07.21 දින සිට සේවයට බඳවාගෙන ඇත. රුපියල් 4540/= ක මාසික වැටුපක් ගෙවීමට වගඋත්තරකාර පාර්ශ්වය එකඟ වී ඇත. නැවතත් 1999.07.08 දිනැති ලිපිය මගින් 2002.07.20 දක්වා පැමිණිලිකරුගේ සේවය කොන්ත්‍රාත් පදනම යටතේ දීර්ඝ කර ඇත. 2001.11.26 දිනැති ලිපිය මගින් පැමිණිලිකරුගේ තනතුර "අර්ධ පුහුණු ලියවන පට්ටල්කරු" ලෙස වෙනස් කරමින් 2001.11.01 දින සිට සේවය ස්ථිර කර ඇත.

එම තනතුරට අදාල වැටුප් විස්තරඃ

| | | |
|---|---|---|
| වැටුප් චක්‍රලේඛය | - | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97 |
| වැටුප් කාණ්ඩය | - | T2-1 |
| වැටුප් පරිමාණය | - | 47880 - 14x1320 - 6x1560 - 75720 |
| පිහිටුවන ලද වැටුප් තලය | - | 4320/= |

2006.11.01 දක්වාම පැමිණිලිකරු අර්ධ පුහුණු ලියවන පට්ටල්කරුවෙකු ලෙස වූ තනතුරු නාමය යටතේ පත්කර වැටුප් ලබා දී තිබුනද 1998.07.01 දින සිටම ඔහු සේවයේ යොදවා ඇත්තේ ගබඩා භාරකරුවෙකු ලෙසයි. පැමිණිලිකරු කියා සිටින්නේ ගබඩාභාරකරුවෙකු ලෙස වගඋත්තරකාර පාර්ශ්වය විසින් තමන්ගේ සේවය ලබා ගත්තද තමන්ට එම තනතුරට හිමි වැටුප් ගෙවා නැති බවයි. එබැවින් තමන්ගේ තනතුරු නාමය ගබඩා භාරකරු ලෙසට වෙනස් කර දෙන මෙන් පැමිණිලිකරු විසින් දිගින් දිගටම වගඋත්තරකාර පාර්ශ්වයෙන් ඉල්ලීම් කර ඇතත් ඉන් පළක් වී නැත.

ප්‍ර : කවුරු වශයෙන්ද මොන පදනම යටතේද?

පි : 1998.07.21 වන දින යන්ත්‍ර ශිල්පියෙකු ලෙස ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට බඳවාගෙන ත්‍රිකුණාමල ධීවර වරායට අනුයුක්ත කරනු ලැබුවා.

ප්‍ර : තමන් මොන පදනමක් යටතේද බඳවා ගත්තේ?

පි : යන්ත්‍ර ශිල්පි තනතුරට කොන්ත්‍රාත් පදනමෙන් අවුරුදු දෙකක කොන්ත්‍රාත් පදනමෙන්.

ප්‍ර : එදින සිට තමන්ට ලැබුන වැඩ මොනවාද?

පි : ගබඩා භාරකරු වශයෙන් වැඩ කලා.

ප්‍ර : යන්ත්‍ර ශිල්පි තනතුරක් ලැබිලා ඒකට අදාල යන්ත්‍රශිල්පී තනතුරට අදාල කිසිම වැඩක් කලේ නැද්ද?

පි : යන්ත්‍ර ශිල්පී තනතුරට අදාල කිසිම වැඩක් කලේ නැහැ.

(2022.10.31 පිටු අංක 2,3)

පැමිණිලිකරු 1998.07.21 දින ලබාගත් මුල් පත්වීමේ දින සිටම ගබඩාභාරකරු වශයෙන් සේවයේ යොදවා ඇති බව තරයේ කියා සිටිමින් ඔහු විසින් සාක්ෂි ලබා දී ඇත. එම ප්‍රකාශය බිඳ හෙළීම සඳහා හරස් ප්‍රශ්න ඇසීමේ දී වගඋත්තරකාර පාර්ශ්වය විසින් ප්‍රබල උත්සාහයක් දරා නැත. පැමිණිලිකරු විසින් තම සේවායොජකයා වන වගඋත්තරකාර ආයතනය වෙත යොමු කර ඇති ලිපි කිහිපයක තම තනතුර "ලියවන පට්ටල් කරු" ලෙස සඳහන් කිරීම පිළිබඳ හරස් ප්‍රශ්න වලදී ප්‍රශ්න කර ඇත. එහිදී පැමිණිලිකරු විසින් පිළිතුරු දී ඇත්තේ එසේ සඳහන් කිරීමට හේතු වූයේ තමන්ට ලිඛිතව ලබා දී ඇති පත්වීම් ලිපියේ සඳහන් වන තනතුර එය වන නිසා බවයි.

ප්‍ර : තමා මේ ස්ථානමාරුව ඉල්ලා සිටින්නේ ධීවර වරායක් වෙත?

පි : ඔව්

ප්‍ර : තමා මේ ලිපියේ සඳහන් කරලා තිබෙනවා සේවය කරන්නේ ලියවන පට්ටල් කරුවෙකු ලෙස කියලා?

පි : ඒක මගේ ස්ථිර තනතුර.

(2022.11.16 දින සාක්ෂි සටහන් පිටු අංක ඃ 21)

ප්‍ර : මේ ලිපියේ තමා සඳහන් කරනවා තමා සේවය කරන්නේ ත්‍රිකුණාමලය කොට්ඨේ ධීවර වරාය නීතිගත සංස්ථාවේ ලියවන පට්ටල් ක්‍රියාකරුවෙකු ලෙස කියලා?

පි : මට ලබාදුන් පත්වීමේ ලිපිය අනුව තමයි මම එහෙම ලියලා තිබෙන්නේ.

(2022.11.16 සාක්ෂි සටහන් පිටු අංක ඃ 22)

පැමිණිලිකරු විසින් තමන් දරන ලියවන පට්ටල්කරු තනතුර ගබඩා භාරකරු ලෙස වෙනස් කර දෙන ලෙද සේවායෝජක වෙතින් කරන ලද ලිඛිත ඉල්ලීමක සඳහන් වනුයේ සෞඛ්‍ය හේතුන් මත තමන්ට ලියවන පට්ටල්කරු ලෙස වැඩ කිරීම අපහසු වී ඇති බවකි. ඒ පිළිබඳ පැමිණිලිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ඔහු පිළිතුරු දි ඇත්තේ තමන් වැඩ කරමින් සිටියේ ගබඩා භාරකරු ලෙස හෙයින් තම වෛද්‍යවරයා උපදෙස් දී ඇත්තේ ගබඩා භාරකරු තනතුරේම දිගටම සේවය කරන ලෙසට බවයි.

ප්‍ර : වෛද්‍යවරයා නොවෙයි තමා කියලා තිබෙන්නේ ලියවන පට්ටල් වැඩ කරන්න අපහසුයි ඒ නිසා රෝගය උත්සන්න වෙනවා කියලා නේද?

පි : ගබඩාභාරකරු තනතුර ඉල්ලා මම ලිපියක් යැව්වා. මම ඒ දවස්වල අසනීප තත්ත්වයෙන් සිටියේ. මම ආයතනයට ඒ දවස් වල වෛද්‍ය වාර්තා පවා ඉදිරිපත් කලා. මට නිවාඩු අනුමත කරලා දීලා තිබෙනවා. මම වෛද්‍යවරයෙකුට කිව්වා මේකයි තත්ත්වය කියලා. වෛද්‍යවරයා කිව්වා ඔයා ලියවන පට්ටලේ වැඩ කරන්න එපා. ඔයා ගබඩා භාරකරු තනතුරේම ඉන්න කියලා. ලියවන පට්ටල් වැඩකලොත් මේ ටික තමයි වෙන්නේ කියලා. ඒක තමයි මම ඔය කියලා තිබෙන්නේ.

(2022.11.29 සාක්ෂි සටහන් පිටු අංක 06)

මේ අනුව පෙනී යන්නේ හරස් ප්‍රශ්න ඇසීමේදි වගඋත්තරකාර පාර්ශ්වයේ නීතිඥවරිය විසින් පැමිණිලිකරු වැඩකරමින් සිට ඇත්තේ යාන්ත්‍රික ශිල්පියෙකු ලෙස සහ ලියවන පට්ටල්කරුවෙකු ලෙස බව ඔප්පු කිරීමට දරන ලද උත්සහය සාර්ථක නොවූ බවත් එම ප්‍රශ්න කිරීම් වලින් තවදුරටත් පහත සඳහන් කරුණු සනාථ වූ බවත්ය.

i. පැමිණිලිකරු 1998.07.01 දින එනම් මුල් පත්වීමේ දින සිටම ගබඩා භාරකරුවෙකු වශයෙන් සේවයේ යොදවා ඇත.

ii. එදින සිටම පැමිණිලිකරු විසින් තම සේවායෝජක ආයතනයෙන් ඉල්ලීම් කරමින් උත්සාහ කර ඇත්තේ තමන්ගේ පත්වීම් ලිපියෙන් සඳහන් තනතුර වෙනුවට ගබඩාභාරකරු තනතුරට අදාල විධිමත් පත්වීම් ලිපියක් ලබා ගැනීම සඳහාය.

වග උත්තරකාර පාර්ශ්වයට ඉහත කරුණු සත්‍යයෙන් තොර බවට ඔප්පු කිරීමට වෙනත් කිසිදු කරුණු දැක්වීමක් කිරීමට නොහැකි විය. පැමිණිලිකරු සත්‍ය වශයෙන්ම යාන්ත්‍රික ශිල්පියෙකු හෝ ලියවන පට්ටල්කරුවෙකු ලෙස සේවය කලේ නම් එම යාන්ත්‍රික වැඩපළ වල පවත්වා ගෙන ගිය ලේඛන (job card හෙවත් වැඩ පැවරුම් ලේඛන) ඉදිරිපත් කරමින් පැමිණිලිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට හැකියාව තිබුනි.

තවද වැඩපොළ සුපවයිසර්වරුන් සහ යාන්ත්‍රික ඉංජිනේරුවරුන්ගේ සාක්ෂි කැඳවීමට හැකියාව තිබුනි. එවැන්නක් සිදුවී නැත.

පැමිණිලිකරු තමන් සේවය කරමින් සිටින අතරතුරදීම තමන් කරනු ලබන රැකියාවේ නිපුණතාවය ඉහළනංවා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා සැපයීම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය නමැති 1981 අංක 03 දරන පාර්ලිමේන්තු පනතකින් සංස්ථාපනය කරන ලද ආයතනයකින් ගබඩා කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක්ද හදාරා ඇති බවට වූ සහතික පිටපතක් ඉදිරිපත් කර සිටි. එම සහතිකය පිළිගත නොහැකි සහතිකයක් බවට හරස් ප්‍රශ්න වලදී කරුණු දැක්වීමට වග උත්තරකාර පාර්ශ්වය අසමත් විය. ඒ අනුව තවදුරටත් පෙනී යන්නේ පැමිණිලිකරු ගබඩාභාරකරුවෙකු වශයෙන් විනා වෙනත් කාර්මික ශිල්පී තනතුරක සේවය කර නැති බවකි.

2006 වර්ෂයේදී වගඋත්තරකාර ආයතනයේ සේවකයින්ගේ උසස්වීම් සම්බන්ධයෙන් සිදුව ඇති අසාධාරණයන් ඉවත්කර සේවකයින්ට සහන සැළසීම වෙනුවෙන් පත් කරන ලද දුක්ගැනවිලි කමිටුව වෙත පැමිණිලිකරු ද තමාට සිදුව ඇති අසාධාරණය ඉවත්කර සහනයක් ලබා ගැනීමට ඉල්ලීමක් කර ඇත. දුක්ගැනවිලි කමිටුවේ නිර්දේශය වී ඇත්තේ 2006 වසරේ සිට පැමිණිලිකරු ගබඩාභාරකරු ලෙස එම තනතුරේ පිහිටුවිය යුතු බවයි. ඒ අනුව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිගේ අංක සීඑච්එෆ්සී/ඒඩී/ඒජ්/අ.ක.නි.ක්‍රි හා 2006.10.27 දිනැති ලිපිය මගින් 2006.11.01 දින සිට පැමිණිලිකරු ගබඩාභාරකරු තනතුරට පෙරදාතම කර පත් කර ඇති බවත් අදාළ වැටුප් පරිමාණය පහත සඳහන් පරිදි බවත් දන්වා ඇත.

වැටුප් පරිමාණය : 111120-7x1320-10x1560-5x2220-147060/=

වැටුප් කාණ්ඩය : TB-2-2-2

වැටුප් තලය : රු.9370/=

චක්‍රලේඛය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2004

මෙම උසස්වීම් ක්‍රියාත්මක කර නැති අතර පැමිණිලිකරු විසින් දිගින් දිගටම කරනු ලැබූ ඉල්ලීම්වලට අනුව එසේ ක්‍රියාත්මක නොකිරීමට හේතු වශයෙන් මානව සම්පත් කළමනාකරු විසින් පැමිණිලිකරුට පවසා ඇත්තේ පැමිණිලිකරු සෑම වර්ෂයක්ම පාහේ (2001,2002,2003 සහ 2005 වර්ෂවල) වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබීමයි. බේරුම්කරණ කටයුතු ආරම්භයේදී පැමිණිලිකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ආරාවුලට සම්බන්ධ කරුණු පිළිබඳ විස්තර ප්‍රකාශයට පිළිතුරු ලෙස 2022.11.14 දින ඉදිරිපත් කරන ලද වගඋත්තරකාර පාර්ශ්වයේ ප්‍රතිඋත්තර ප්‍රකාශයේ 4(iv) ඡේදය මගින්ද ඉහත මානව සම්පත් කළමණාකරු විසින් කරන ලද ප්‍රකාශය එනම් ඉහත පත්වීම ක්‍රියාත්මක නොකිරීමට හේතුව පසුගිය වර්ෂවල වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබීම බව සඳහන් කර ඇත.

මෙම ගැටලුව සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීමෙන් පසු සේව්‍ය සේවක දෙපාර්ශ්වය කම්කරු කාර්යාලයට කැඳවා පැමිණිලි විභාගය පැවැත්වීමෙන් පසුව පැමිණිලිකරුට 2006.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගබඩාභාරකරු තනතුර ලබා දීමට සේවා යෝජක පාර්ශ්වය විසින් එකඟත්වය පළකර 2011.11.23 දිනැති ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිගේ අංක CHFC/HR/2011/2145 දරන ලිපිය මගින් ගබඩාභාරකරු තනතුර සඳහා පත්වීමක් ලබා දී ඇත.

ඊට අදාළ වැටුප් පරිමාණය : 111120-7x1320-10x1560-5x2220-147060

වැටුප් කාණ්ඩය :TB-2-2-2

චක්‍රලේඛය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2004

නමුත් 2006 කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව 2006.01.01 දින සිට නියම කරන ලද වැටුප් ගෙවීම කර ඇත.

වැටුප් පරිමාණය: 13320-10x120-7x140-12x260-12x315-22760

වැටුප් කාණ්ඩය : MA1-1-2006, C2

චක්‍රලේඛය : : කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 30

2006.11.01 දින සිට අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ වන 2011.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වගඋත්තරකාර ආයතනයේ සභාපතිගේ අංක: CFHC/HR/2012/පොදු හා 2012.09.10 දිනැති ලිපිය මගින් ගබඩාභාරකරු II තනතුරෙහි පැමිණිලිකරු යළිත් පිහිටුවා ඇත.

වැටුප් පරිමාණය: 1340-10x145-7x170-12x290-12x345-23710

වැටුප් කාණ්ඩය : MA 1-2-2006, C2

වැටුප් තලය : 17250/=

චක්‍රලේඛය : කළමනාකරණ සේවා චක්‍රලේඛ 30(i)

මෙම ලබා දී ඇති ශ්‍රේණිය වැරදි බවත් ලබා දිය යුත්තේ ගබඩාභාරකරු ii ශ්‍රේණිය නොව ගබඩාභාරකරු i ශ්‍රේණිය බවත් ඒ අනුව

2011.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දී ඇති පත්වීමෙහි ශ්‍රේණිය i ලෙස සංශෝධනය විය යුතු බවත් කියමින් පැමිණිලිකරු විසින් නැවතත් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත. පැමිණිලිකරු විසින් පෙන්වා දෙන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97 අනුව ගබඩාභාරකරු ii සහ i ලෙස ශ්‍රේණි දෙකක් පමණක් හඳුන්වා දී තිබූ බවත් ඒ අනුව තමන්ට 2006.11.01 දිනට ලැබී තිබූ තනතුර ගබඩාභාරකරු ii වියයුතු බවත් එබැවින් 2011.11.01 දිනට ලැබිය යුතුව ඇත්තේ ගබඩාභාරකරු i විය යුතු බවත්ය.

කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිලි විභාගයෙන් පසුව වග උත්තරකාර ආයතනය විසින් එහි සභාපතියේ අංක : CFHC/ HR/2013/1309 හා 2013.11.26 දිනැති ලිපිය මගින් වරද නිවැරදි කරමින් 2011.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගබඩාභාරකරු i තනතුරේ පිහිටුවා ඇත.

වැටුප් පරිමාණය : 13450-10x145-7x170-12x290-12x345-23710

වැටුප් කාණ්ඩය : MA1-2-2006, C2

වැටුප් තලය :රු.17540.00

ඉහත ගබඩාභාරකරු ii තනතුරට 2006.11.01 දින සිටද ගබඩාභාරකරු i තනතුරට 2011.11.01 දින සිට ද පත්කිරීම හේතුවෙන් පැමිණිලිකරුට ගෙවිය යුතු හිඟවැටුප් සියල්ලම ගෙවා ඇති බව වගඋත්තරකාර පාර්ශ්වය විසින් කියා සිටි. (වගඋත්තරකාර පාර්ශ්වය විසින් 2022.11.14 දින ඉදිරිපත් කර ඇති ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳ විස්තර ප්‍රකාශයේ 7(iii) ඡේදය මගින් මෙම හිඟ මුදල් සම්පූර්ණයෙන්ම පැමිණිලිකරුට ගෙවා ඇති බව ප්‍රකාශ කරයි) පැමිණිලිකාර පාර්ශ්වය එම ප්‍රකාශය සම්බන්ධයෙන් හබ නොකරයි.

ගබඩාභාරකරු ii සහ ගබඩාභාරකරු i යන තනතුරු හැර පළමු පාර්ශ්වය වෙත ලබා දීමට වෙනත් උසස්වීමක් නැති බව වගඋත්තරකාර පාර්ශ්වය කියා සිටි.

"පළමු පාර්ශ්වය වෙත ලබා දිය හැකි සියලු උසස්වීම් මේ වන විට ලබා දී ඇති බවත්"

(වගඋත්තරකාර පාර්ශ්වය විසින් 2022.11.14 දින ඉදිරිපත් කර ඇති ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳ විස්තර ප්‍රකාශයක් 10(iv) ඡේදය)

ලබා දී ඇති උසස්වීම් හා වැටුප් විස්තර සහිත සටහනක් පහත දක්වා ඇත.

**2022.11.14 පැමිණිලිකරුට 1998.7.1 දින සිට සැබෑ ලෙසම ලැබී ඇති තනතුරු නාම, තනතුර ලැබී ඇති දිනයන් සහ වැටුප් විස්තර**

| *කාල අන්තරය* | *තනතුර* | *වැටුප් කාණ්ඩය* | *චක්‍රලේඛය* | *වැටුප් තලය* | *වැටුප් පරිමාණය* |
|---|---|---|---|---|---|
| 1998-07-21<br>2001-11-01 | යන්ත්‍ර ශිල්පි | කොන්ත්‍රාත් පදනම යටතේ | කොන්ත්‍රාත් පදනම යටතේ | කොන්ත්‍රාත් පදනම යටතේ | මසකට රු. 4540.00 |
| 2011-11-01<br>2004-01-01 | අර්ධ පුහුණු ලියවන පට්ටල්කරු | T-2-1 | රා.ප.ච 2/97 | 4320/- | වාර්ෂික<br>47880-14x1320-6x1560-75720<br>මාසික<br>3990-14x110-6x130-6310 |
| 2004-01-01<br>2004-12-01 | අර්ධ පුහුණු ලියවන පට්ටල්කරු | TA-2-1 | රා.ප.ච 15/2003 | | වාර්ෂික<br>62880-14x1320-6x1560-90720<br>මාසික<br>5240-14x110-6x130-7560 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2004-12-01<br>2006-01-01 | අර්ධ පුහුණු ලියවන පට්ටල්කරු | TB-2-1 | රා.ප.ච 9/004 | | වාර්ෂික<br>101880-14x1320-6x1560-129720<br>මාසික<br>8490-14x110-6x130-10810 |
| 2006-01-01<br>2006-11-01 | අර්ධ පුහුණු ලියවන පට්ටල්කරු | MA1-1-2006 C2 | කළ. සේවා 30 | | 13320-10x120-7x140-12x260-12x315-22760 |
| 2006-11-01<br>2009-01-01 | ගබඩාභාරකරු ii (කළමනාකරණ සහකාර ii) | MA1-1-2006 C2 | කළ. සේවා 30 | | 13320-10x120-7x140-12x260-12x315-22760 |
| 2009-01-01<br>2011-01-01 | ගබඩාභාරකරු ii (කළමනාකරණ සහකාර ii) | MA1-2-2006A C2 | කළ. සේවා 30(i) | | 13450-10x145-7x170-12x290-12x345-23710 |
| 2011-01-01<br>2016-01-01 | ගබඩාභාරකරු i (කළමනාකරණ සහකාර ii) | MA1-2-2006A C2 | කළ. සේවා 30(i) | 17540/- | 13450-10x145-7x170-12x290-12x345-23710 |
| 2016-01-01<br>2016-11-01 | කළමනාකරණ සහකාර ii | 2/2016 | | | |
| 2016-11-01<br>2023-06-01 | කළමනාකරණ සහකාර ii | 2/2016 | | | |

**02. පැමිණිලිකරු සඳහා වගඋත්තරකාර ආයතනය තුළ උසස්වීම් පටිපාටියක් ක්‍රියාත්මක වෙමින් තිබුනේද?**

වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් බේරුම්කරණය ආරම්භයේදීම ඉදිරිපත් කරන ලද 2022.10.17 දිනැති ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳ විස්තර ප්‍රකාශයේ අංක 5,6,8 දරන ඡේද මගින් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවකයන්ගේ උසස්කිරීම් සම්බන්ධ පටිපාටියක් තිබූ බවට ප්‍රකාශ කර ඇත.

*5 වන ඡේදය*

තවද පළමු පාර්ශ්වය, ගබඩා භාරකරු iii ශ්‍රේණියේ තනතුරකට පත් කළ දින සිට වසර 05ක සේවා කාලය සළකා 2011.11.01 දින සිට ගබඩා භාරකරු ii ශ්‍රේණියට පත් කර ඇති බවත් කියා සිටී.

*6 වන ඡේදය*

පළමු පාර්ශ්වය ගබඩා භාරකරු ii ශ්‍රේණියට පත් කළ 2011.11.01 දින පටන් වසර 5ක සේවා කාලය සළකා ගබඩා භාරකරු i ශ්‍රේණියට පත් කළ යුතුව තිබූ දිනය 2016.11.01 වුවත් නියමිත දිනට වසර 3කට පූර්වයෙන් 2013.11.01 දින සිට ක්‍රියත්මක වන පරිදි පළමු පාර්ශ්වය ගබඩා භාරකරු i ශ්‍රේණියට පත්කර ඇති බවත් ඒ අනුව වැටුප් ගෙවා ඇති බවත් කියා සිටී.

*8 වන ඡේදය*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සඳහා 2013 වර්ෂයේ අනුමත සේවක අවශ්‍යතා ලේඛනය හා 2018 වර්ෂයේ සේවක බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති බවත් එකී උසස් කිරීමේ හා බඳවා ගැනීමේ පාටිපාටියට අනුව උසස්වීමේ කාලසීමාව වසර 5 වෙනුවට වසර 10ක් බවට නියම කර ඇති බවත් කියා සිටී.

පැමිණිලිකාර පළමු පාර්ශ්වය විසින් 2022.10.10 දින ඉදිරිපත් කරන ලද ආරවුලට හේතු වී ඇති කරුණු පිළිබඳ ප්‍රකාශයට ප්‍රතිඋත්තර සපයන ලද වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද 2022.11.14 දිනැති දෙවන ප්‍රකාශයේ ඡේද අංක 8(ii), 11(ii), 12(iii) දරන ඡේද මගින් ද ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ උසස්වීම් පටිපාටියක් පැවති බවට ප්‍රකාශ කර ඇත.

*8 (ii) වන ඡේදය*

පළමු පාර්ශ්වය ගබඩා භාරකරු ii ශ්‍රේණියට පත්කළ දින සිට වසර 5ක සේවා කාලය සළකමින් 2011.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පළමු පාර්ශ්වය ගබඩා භාරකරු i ශ්‍රේණියට පත්කර ඇති බවත් ය.

*11 (ii) වන ඡේදය*

අනෙකුත් සේවකයන් හා සමගාමීව පළමු පාර්ශ්වයට වසර 5න් 5ට උසස්වීම් ලබා දී ඇති බවත් පළමු පාර්ශ්වයට කිසිඳු අයුරකින් අසාධාරණයක් සිදු කර නොමැති බවත් ය.

*12(iii) වන ඡේදය*

2018 නව බඳවා ගැනීමේ පටිපාටිය හා 2013 සේවක අවශ්‍යතා ලේඛනය අනුව උසස්වීම් ලබා දීම සිදුවන්නේ වසර 10න් 10ට පමණක් වන බවත්ය.

ඒ අනුව සේවකයකුගේ සේවා කාලය අවුරුදු 5න් 5ට අදාළ වෙනත් සුදුසුකම් සපුරා ඇත්නම් උසස්වීම් පිරිනැමීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වී ඇත.

බේරුම්කරු වශයෙන් මා ඉදිරියේදීම 2022.10.31 සිට 2023.04.24 දින විභාග වූ A/63/2022 නඩුවේදී සාක්ෂි ලබා දුන් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වැඩ බලන මානව සම්පත් කළමණාකරු විසින් සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කරන ලද පරිදි 2001 වර්ෂයේදී මෙම ආයතනය මගින් සේවකයින්ගේ බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටියක් පිළියෙළ කර ඇත. එම ලේඛනය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවා ගෙන නැති වුවද අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව එහි සඳහන්ව තිබූ ඉහත සඳහන් උසස්වීම් පටිපාටිය පරිචයක් ලෙස 2018.04.26 වෙනි දින දක්වා ක්‍රියාත්මක කර ඇත.

2018.04.26 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව 2018.04.26 දින සිට සේවා කාලය අවුරුදු 10න් 10ට වෙනත් සුදුසුකම් සපුරා තිබේ නම් උසස්වීම් ලබා දිය හැකිවනු ඇත

සාක්ෂි විභාගයේදී ලබා දුන් සාක්ෂි අනුව පෙනී යන්නේ මෙම අවුරුදු 5න් 5ට උසස්වීම් ලබා දීමේ ක්‍රමය සියලු සේවකයින් වෙනුවෙන් සාධාරණව ක්‍රියාත්මක කර නැති බවකි. පළමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දෙමින් ලසන්ත ධම්මික ගුණසිංහ වෙල්ලප්පුලි විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම වගඋත්තරකාර ආයතනය විසින් අවුරුදු 5න් 5ට ලබා දෙන උසස්වීම් අවිධිමත් ලෙස සහ දේශපාලන බලපෑම් මත හිතුවක්කාර අන්දමින් ක්‍රියාත්මක කර ඇති බවකි. නමුත් වගඋත්තරකාර පාර්ශ්වය විසින් එම ප්‍රකාශය නිවැරදි නොවන බවට තහවුරු කිරීමට හරස් ප්‍රශ්න ඇසීමේදී කිසිඳු ප්‍රයත්නයක් දරා නැත.

ප්‍ර : තමාට i ශ්‍රේණිය ලැබෙන්නේ කුමන වසරේද?

පි : 2010 වසරේදී.

ප්‍ර : ඒ කියන්නේ දෙවන ශ්‍රේණියට උසස්වීම් ලබා වසර කීයකින්ද තමන්ට i ශ්‍රේණිය ලැබෙන්නේ?

පි : වසර හතරකින්.

**අධිකරණයෙන්**

ප්‍ර : තමන් ඉල්ලීමක් කළාද?

පි : ඔව්. දුක්ගැනවිලි කමිටුවෙන් ඉල්ලීමක් කළා. ඉල්ලපු සියල්ලන්ටම ඒ වෙලාවේ දුන්නා.

ප්‍ර : ඒ කියන්නේ නව අධ්‍යක්ෂ මණ්ඩලයක් ආපු ගමන්ද?

පි : ඔව්.

(2023.01.05 සාක්ෂි සටහන් පිටු අංක 06)

ප්‍ර : ඊට පසු මොකක්ද සිද්ධ වුනේ?

පි : 2013 වසරේ අධි ශ්‍රේණිය ලබා දුන්නා.

(2023.01.05 වන දින සාක්ෂි සටහන් පිටු අංක 07)

උසස්වීම් ලබා දීමේදී යම් සේවකයෙකුගේ සේවා කාලය වසර 5 ක් සළකා බැලීමේදී එම සේවකයා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ලද සේවා කාලයද එම අවුරුදු 5 තුළට ගැනෙන බවට සාක්ෂි මගින් තහවුරු විය.

පැමිණිලිකරු කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන ලද මුල් වසර 03 ක කාලය සඳහා ද වැටුප් වර්ධක ලබා දී ඇති බැවින් පැමිණිලිකරු කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන ලද අවුරුදු 3ක කාලය ඔහුගේ උසස්වීම් සඳහාද සළකා බලා ඇති බව පෙනේ. පැමිණිලිකරු 2001.01.11 දින සිට ස්ථිර කරමින් ඔහුට හිමි වැටුප් පරිමාණයක්ද ලබා දී ඇත.

වැටුප් පරිමාණය : 47880-14x1320-6x1560-75720

වැටුප් කාණ්ඩය : T -2 - 1

වැටුප් තලය : රු. 4320/=

චක්‍රලේඛය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97

පැමිණිලිකරුගේ වැටුප් තලය රු. 4320/= ක් ලෙස තීරණය කර ඇත්තේ වැටුප් වර්ධක තුනක්ද ලබා දෙමිනි. එනම් පැමිණිලිකරුගේ මුල් පත්වීමේ දිනය වන 1998.07.01 සිට 2001.11.01 දක්වා කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කළ වසර තුනක කාලය සඳහා වැටුප් වර්ධක 3 ක් ලබා දී ඇත.

ප්‍ර : එතකොට ඔබට මේ ලබා දී තිබුණ ස්ථිර පත්වීම ලබා දෙනකොට ලබා දී තිබුණ වැටුප් තලය රු: 4320.00යි?

පි : ඔව්.

ප්‍ර : ඒ වැටුප් වර්ධක කීයක් එකතු කරලාද?

පි : වැටුප් වර්ධක 3ක් එකතු කරලා.

ප්‍ර : ඒ කියන්නේ?

පි : මගේ කොන්ත්‍රාත් සේවා කාලය පදනම් කරගෙන වැටුප් වර්ධක 3ක් ලබා දීලත් තිබෙනවා.

ප්‍ර : කොන්ත්‍රාත් කාලයද පදනම් කරගෙන ස්ථිර පත්වීම ලබා දෙනකොට වැටුප් වර්ධක තුනක් එකතු කර ලබා දුන්නා කියලාද කියන්නේ?

පි : ඔව්.

(2022.10.31 සාක්ෂි සටහන් පිටු අංක 14)

පැමිණිලිකරුගේ මූලික සාක්ෂි විභාගය අවසන් කරමින් ප්‍රකාශයක් කිරීමට යෙදුනි. එමගින් ඔහු ඉල්ලා සිටින්නේ 1998 වර්ෂයේ සිටම තමාගේ සේවා කාලය සළකා බලමින් තමන්ට හිමි උසස්වීම් ලබා දෙන ලෙසයි. නමුත් වගඋත්තරකාර පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න ඇසීමේදී මෙම කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන ලද කාලයද සළකා බලමින් උසස්වීම් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් කිසිඳු ප්‍රශ්න කිරීමක් නොකිරීමට කටයුතු කර ඇත.

ප්‍ර : අවසාන වශයෙන් තමා මේ ගරු අධිකරණයෙන් බලාපොරොත්තු වන සහන කවරේද?

පි : 1998 වර්ෂයේ සිට මම මෙම ආයතනයේ ගබඩාභාරකරුවෙකු ලෙසට තමයි වැඩ කළේ. මගෙන් වැඩ ගත්තේ. මම දිගටම වැඩ කලේ විවිධ දුෂ්කර කාර්යවල දිගින් දිගටම මම ගබඩාභාරකරු කියන තනතුර ලබා දෙන්න කියලා ඉල්ලුම් කළත් ආයතනය මගෙන් වැඩ ගන්නට මට ඒ තනතුර ලබා දීමට කටයුතු කළේ නැහැ. මගේ සේවා කාලය තුළ 1998 සිට මට ගබඩා භාරකරු තනතුර ලබා දීලා ඊට අදාළ අධි ශ්‍රේණිය ලබා දෙන ලෙසත් ඔබතුමාට සෑහීමකට පත්විය හැකි ඕනෑම දෙයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

(2022,11,16 සාක්ෂි සටහන් පිටු අංක 16)

මේ සියලු කරුණු සළකා බැලීමේදී පැමිණිලිකරු කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන ලද කාලයද උසස්වීම් කිරීමේදී සළකා බලන අවුරුදු 5 ක කාලය සඳහා අදාළ කරගත හැකි බවට තීරණය කරමි.

මෙම උසස්වීම් ලබා දීමේ පටිපාටිය 2001 වර්ෂයේ සිටම ක්‍රියාත්මක වී ඇති බව සාක්ෂි මගින් අනාවරණය වේ.

ප්‍ර : තමා දිගටම කොන්ත්‍රාත් පදනම මතද සේවය කළේ?

පි : නැහැ මම 2001 වසරේ ස්ථිර සේවයට ආවා.

ප්‍ර : මේ තිබෙන්නේ එසේ අනුයුක්ත කරන ලද ලිපියද?

පි : ඔව්.

ප්‍ර : මේ පත්වීමේ ලිපිය අනුව තමන් පත්කළේ කුමන ශ්‍රේණියකටද?

පි : ලිපිකරු ii ශ්‍රේණිය.

ප්‍ර : තමා ලිපිකරු iii ශ්‍රේණියට පත් වීමෙන් පසු දිගටම සේවය කළේ ලිපිකරු iii ශ්‍රේණියේද?

පි : නැහැ 2006 වසරේ මම ii වන ශ්‍රේණියට ආවා.

(පැමිණිලිකරු වෙනුවෙන් සාක්ෂි ලබා දුන් ලසන්ත ධම්මික ගුණසිංහ වෙල්ලප්පුලි මහතාගේ 2023.01.05 වන දින සාක්ෂි සටහන් පිටු අංක : 3)

නමුත් වගඋත්තරකාර පාර්ශ්වයේ හරස් ප්‍රශ්න ඇසීමේදී මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කර නැත. තවද අවුරුදු 5න් 5ට උසස්වීම් ලබා දීමේදී සේවකයින්ගේ වැටුප් රහිත නිවාඩු ගැනීම් සම්බන්ධයෙන් නොසළකා මෙම උසස්වීම් කර ඇති නමුත් පැමිණිලිකරුට 2006.11.01 දිනට ගබඩා භාරකරු ලෙස කරන ලද පත්වීම පවා 2011 වර්ෂය දක්වා ක්‍රියාත්මක නොකිරීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත්තේ පැමිණිලිකරුගේ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සළකා බලමිනි.

පැමිණිලිකරු වෙනුවෙන් සාක්ෂි ලබා දුන් කේ.එම්.එන්.ආර්.දිසානායක මහතා සාක්ෂි දෙමින් කියා සිටින්නේ පැමිණිලිකරු හැර තමා දන්නා පරිදි වැටුප් රහිත නිවාඩු ලබා ඇති සියලු සේවකයින්ට උසස්වීම් ලබා දී ඇති බවයි.

ප්‍ර : දැන් තමුන් කියන්නේ කළමනාකරණ සහකරුවන්ට සහ අනෙකුත් සියලු ශ්‍රේණිවලට (උසස්වීම්) දුන්නා කියලා නේද දැන් තමන් කිව්වේ?

පි : ඔව්.

ප්‍ර : ඒ අයගේ වැටුප් රහිත නිවාඩුත් සළකා බලාද දීලා තිබුනේ අනෙක් ශ්‍රේණිවලට?

පි : ඒක පැහැදිලිව සටහන් කරන්න මම දන්නේ නැහැ. සමහර වැටුප් රහිත අයට නොදීපු අවස්ථාත් තිබුණා. ඒ නොදීපු ඔක්කෝටමත් පසුකාලීනය දීලා තිබුණා.

(2023.02.14 සාක්ෂි සටහන් පිටු අංකය 24)

03. එම උසස්වීම් පටිපාටියට අනුව ගබඩාභාරකරු අධි ශ්‍රේණිය i වන JM1-1 වැටුප් කාණ්ඩයේ වැටුප් පරිමාණයකට පැමිණිලිකරු හිමිකම් ලබන්නේද? හිමිකම් ලබන්නේ නම් කවදා සිටද?

පැමිණිලිකරු 1998.07.01 දින සිට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ගබඩා භාරකරුවෙකු ලෙස අද දක්වා සේවයේ යොදවා ඇති බවට ලැබී ඇති සාක්ෂි විශ්ලේෂණයේදී අනාවරණය විය. එමෙන්ම වගඋත්තරකාර ආයතනයේ සේවක උසස්වීම් සම්බන්ධයෙන් වූ උසස්වීම් පටිපාටියක් 2001 වර්ෂයේ සිටම පරිචයක් ලෙස ක්‍රියාත්මක වී ඇති බවටද සාක්ෂි මගින් තහවුරු විය.

පැමිණිලිකරු වෙනුවෙන් සාක්ෂි ලබාදුන් සලන්ත ධම්මික ගුණසිංහ වෙල්ලප්පුලි යන අය සාක්ෂි දෙමින් කියා සිටියේ 2001 වසරේ තමන් ස්ථිර සේවයට පත්කරන ලද බවත් එතැන් සිට අවුරුදු 5 කින් තමන්ට උසස්වීමක් ලබාදුන් බවත්ය.

ප්‍ර : 2006 වසරේදී තමාව ලිපිකරු ii ශ්‍රේණියට උසස් කළාද?

පි : කළමණාකාර සහකාර ලෙස උසස් කළා.

ප්‍ර. 2006 වසරේදී තමාගේ තනතුරු නාම වෙනස් කළාද?

පි. ඔව්

ප්‍ර. කුමක් ලෙසද වෙනස් කළේ?

පි. කළමනාකාර සහකාර ලෙස

ප්‍ර. කළමනාකාර සහකාර කාණ්ඩයට ඇතුළත් කළාද?

පි. ඔව්

ප්‍ර. තමා 2001 දී මුල්පත්වීම ලැබුවා. ඊට වසර 5කට පසුව තමාට ii ශ්‍රේණිය දුන්නා කියලා තමා කියා සිටියා?

පි. ඔව්

(2023.01.05 සාක්ෂි සටහන් පිටු අංක : 4,5) මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වය හබකර නැත.

එම උසස්වීම් පටිපාටිය සියලු සේවකයින් සම්බන්ධයෙන් සාධාරණව ක්‍රියාත්මක නොකිරීම නිසා පැමිණිලිකරුට බලවත් අසාධාරණයක් සිදුව ඇති බව නිරීක්ෂණය වේ. එවැනි අසාධාරණයක් සිදු නොවුයේ නම් ඔහුට ලැබිය යුතු උසස්වීම් කවරේද යන්න සලකා බැලීමෙන් සිදු වී ඇති අසාධාරණයට ලබා දිය යුතු සහන කවරේද යන්න තීරණය කිරීමට හැකිවනු ඇත.

1998.07.21 දින සිට 2001.11.01 දින දක්වා පැමිණිලිකරු කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කර ඇති අතර 2001.11.01 දින සිට ස්ථිර සේවයේ පිහිටුවා ඇත. අවුරුදු 5න් 5ට ලබා දිය යුතු උසස්වීම් ලබා දීමේදී සම්පූර්ණ කර ඇති අවුරුදු 5ක සේවා කාලය සලකා බලනුයේ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන ලද කාලයද ඇතුළත් වන පරිදිය.

1998.07.01 දින සිට පැමිණිලිකරු ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ගබඩා භාරකරුවෙකු ලෙස සේවයේ යොදවා ඇති බැවින් ද අවුරුදු 5න් 5ට උසස්වීම් පටිපාටියක් ක්‍රියාත්මක වෙමින් තිබුණ බවට තහවුරු වී ඇති බැවින් ද පැමිණිලිකරුගේ මීළඟ උසස්වීම ලෙස ලබා දිය යුතුව තිබුනේ 2003.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගබඩා භාරකරු i ශ්‍රේණියයි. එම තනතුරුට අදාළ,

වැටුප් පරිමාණය : 57120-7x130-15x1560-89760

වැටුප් කාණ්ඩය : T -2 -2 -2

අදාළ චක්‍රලේඛය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97

6/2006 චක්‍රලේඛය මගින් යෝජිත කළමණාකරණ සේවා චක්‍රලේඛ 30 ක්‍රියාත්මක වීමට පෙර 2006.11.01 දින සිට ගබඩාභාරකරු ii ශ්‍රේණියේ වැටුප් කාණ්ඩය ලෙස TB-2-2-2 වගඋත්තරකාර ආයතනයේ සභාපතිගේ අංක සීඑච්/එච්සී/ඒවී/ඒජ්/අ.ක.කි.ක්‍රි.හා 2006.10.27 දිනැති ලිපියේ සඳහන් කර ඇත. එබැවින් 9/2004 රා.ප. චක්‍රලේඛය අනුව TB-2-2-2 වැටුප් කාණ්ඩය 2004.12.01 දින සිට ක්‍රියාත්මක වූ බවත් රා.ප. චක්‍රලේඛ 15/2003 අනුව TA -2-2-2 වැටුප් කාණ්ඩය 2004.04.01 දින සිට ක්‍රියාත්මක වූ බවත් රා.ප.චක්‍රලේඛ 2/97 අනුව T-2-2-2 වැටුප් කාණ්ඩය 1997.01.01 දින සිට ක්‍රියාත්මක වීම සිදුව ඇති බැවින් ඒ වැටුප් කාණ්ඩය T-2-2-2 ලෙස තීරණය කළෙමි.

මේ අනුව 2003.07.01 දින සිට ගබඩාභාරකරු i ශ්‍රේණියේ තනතුරක සේවය කරමින් සිටින විට 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව පිළියෙල කරන ලද ප්‍රතිව්‍යුහගතකරණ ලේඛනය (A14) අනුව ගබඩා භාරකරු i සහ ගබඩාභාරකරු ii යන තනතුරු කළමනාකරණ සහකාර ii යටතට 2006.01.01 දින සිට ඇතුළත් කර පැමිණිලිකරුගේ නව තනතුරු කළමනාකරණ ලෙස හඳුන්වන ලදී.

2003.07.01 සිට සේවා කාලය අවුරුදු 5 සම්පූර්ණ වන 2008.07.01 දිනට පැමිණිලිකරුට ලැබිය යුතුව තිබූ මීළඟ උසස්වීම වනුයේ කළමණාකරණ සහකාර i තනතුරයි. 2008.07.01 සිට සේවා කාලය අවුරුදු 5ක් සම්පූර්ණ වන 2013.07.01 දිනට ඔහුට ලැබිය යුතුව තිබූ උසස්වීම වනුයේ කළමණාකරණ සහකාර අධි ශ්‍රේණිය ii තනතුර වේ. නමුත් වගඋත්තරකාර පාර්ශ්වය විසින් 2023.03.15 දින

X1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද සාමාන්‍යාධිකාරිගේ ලිපිය අනුව පැමිණිලිකාර පළමු පාර්ශ්වය සහ වගඋත්තරකාර දෙවන පාර්ශ්වය කිසියම් එකගතාවයකට පත්ව ඇති බව කියා සිටින ලදී. එම එකගතාවය නම් වගඋත්තරකාර පාර්ශ්වය විසින් 2013.02.12 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පැමිණිලිකරු කළමණාකරණ සහකාර අධි ශ්‍රේණියේ ii තනතුරෙහි පිහිටුවන බවටත් 2018.02.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකරණ සහකාර අධි ශ්‍රේණිය i තනතුරෙහි පිහිටුවන බවටත්ය.

මේ අනුව 2013.07.01 දිනට ලබාදිය යුතු කළමනාකරණ සහකාර අධි ශ්‍රේණිය ii තනතුර ඉහත එකගතාවය පරිදි 2013.02.12 දිනට ලබාදිය යුතු බවට තීරණය කරමි. මීළග අවුරුදු 5 සම්පූර්ණ කිරීමෙන් පසුව 2018.02.12 දිනට පැමිණිලිකරුගේ ඊළග උසස්වීම වන කළමණාකරණ සහකාර අධි ශ්‍රේණිය i තනතුර ලබා දිය යුතුව ඇත.

1998.07.01 දිනට ලැබිය යුතුව තිබුණ ගබඩාභාරකරු ii තනතුර සත්‍ය ලෙසම පැමිණිලිකරුට ලබා දී තිබුණේ 2006.11.01 දින සිටය. එසේ කිරීමට හේතුව ලෙස වගඋත්තරකාර පාර්ශවය විසින් පෙන්වා සිටීමට උත්සාහ කරනු ලබන්නේ දෙපාර්ශ්වය අතර කම්කරු කාර්යාලයේදී ඇති කරගත් සමථයේදී එකග වූ කොන්දේසි මත වගඋත්තරකාර පාර්ශ්වයට එසේ කටයුතු කිරීමට සිදුවූ බවයි. 2022.11.14 දිනැති වගඋත්තරකාර දෙවන පාර්ශ්වය මගින් ඉදිරිපත් කර ඇති ආරවුලට හේතු වී පවත්නා කරුණු පිළිබඳ විස්තර ප්‍රකාශනයේ 8(i) ඡේදය මගින් මේ බව සඳහන් කර ඇත.

නමුත් සාක්ෂි විභාගයේදී හරස් ප්‍රශ්නවලට උත්තර දෙමින් පැමිණිලිකරු අවධාරණයෙන් ප්‍රකාශ කරනුයේ තමන්ට මෙම තනතුර 2006.11.01 දිනට ලැබුනේ වගඋත්තරකාර පාර්ශ්වය සමග තමන් කිසිදු ලිඛිත හෝ වාචික එකගතාවයකින් ඇති කර ගැනීමක් නිසා නොවන බවයි.

ප්‍ර. මෙහි පැහැදිලිව සඳහන් වෙනවා නේද සමථ කොන්දේසි හතරක් යටතේ දෙපාර්ශවයේ එකගතාවයෙන් තමයි මේ තනතුරේ පිහිටුවන්නේ කියලා?

පි. ඒකේ සඳහන් වෙලා තිබෙනවා.

ප්‍ර. තමා එදා තනතුර භාරගන්නේ කැමැත්තෙන් නේද?

පි. ඔව්.

ප්‍ර. 2006 වසරේ සිට තමාව ගබඩා භාරකරු තනතුරේ පිහිටුවීමට දෙපාර්ශවයේ එකගතාවය මත තමා තනතුර භාර ගන්නවා?

පි. ඔව්. 1998 වසරේ සිට තමයි මේ තනතුර ඉල්ලුවේ. නමුත් ආයතනය දුක්ගැනවිලි කමිටුවේ ලිපිය පාදක කරගෙන එදා ඉඳලා දෙන්නම් කියලා කැමති වුනා. ඊට පසුව මමත් ඒකට කැමති වුනා.

ප්‍ර. තමා ඒ තනතුර භාර ගත්තේ තමාගේ ස්ව කැමැත්තෙන්ද?

පි. මම ඒ තනතුර දිගින් දිගටම ඉල්ලුවා. මම සැහෙන පීඩනයකින් තමයි සිටියේ. මට 2006 වසරේ සිට දෙන්නම් කියලා කිව්වාම මම එදා ඉඳලා ගන්න කැමති වුනා.

ප්‍ර. මම අහන්නේ තමා කැමති වෙලා නේද මේ තනතුර ගන්නේ?

පි. ඔව්

ප්‍ර. 2001 වසරේ සිට දෙන්න කියලා කම්කරු කාර්යාලයට කිව්වේ නැද්ද?

පි. මම කිව්වා. ආයතනයේ මානව සම්පත් කළමණාකරු කිව්වා දුක්ගැනවිලි කමිටුවෙන් පසුව තමයි ගොඩාක් අයට උසස්වීම් දුන්නේ. ඒක පදනම කරගෙන දෙමු කියලා තමයි කවුරුත් කථා වුනේ.

(2022.11.29 දින සාක්ෂි සටහන් පිටු අංක 16,17)

කම්කරු කාර්යාලයේදී පැමිණිලිකරු හා වගඋත්තරකාර පාර්ශ්වය සමග යම් සමථ ගිවිසුමක් ඇති වී ඇති ද යන්න පරීක්ෂා කර බැලීම සඳහා මෙම ආරවුලට අදාළව කාර්මික සම්බන්ධතා අංශයේ ඇති අංක : IR/COM/04/2020/144 දරන මුල් ලිපිගොනුව ගෙන්වා ගෙන පරීක්ෂා කළෙමි. එම ලිපිගොනුව අනුව කිසිදු ලිඛිත සමථ ගිවිසුමක් ඇති කර ගෙන නොමැති බව අනාවරණය විය. ඒ අනුව 2006.11.01 දින සිට පැමිණිලිකරුට ලබා දී ඇති උසස්වීම පැමිණිලිකරු සිය කැමැත්තෙන් ඇති කරගත් එකගතාවයක් මත

සිදුව නැති බවත් ඔහු දිගින් දිගටම ගබඩාභාරකරු ලෙස තමාට මෙම තනතුර 1998 වසරේ සිට ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවටත් තීරණය කරමි.
නිසි පරිදි නියමිත දිනට උසස්වීම් ලබා දුන්නේ නම් ලබාදිය යුතු දිනයන්, තනතුරු සහ වැටුප් විස්තර සහිත සටහනක් පහත දැක්වේ.

| *කාල අන්තරය* | *තනතුර* | *වැටුප් කාණ්ඩය* | *චක්‍රලේඛය* | *වැටුප් තලය* | *වැටුප් පරිමාණය* |
|---|---|---|---|---|---|
| 1998-07-01-2003-7-21 | ගබඩා භාරකරු ii | T-2-2-2 | රා.ප.ච. 2/97 | | වාර්ෂික 57120-7x130-15x 1560-89760<br>මාසික<br>4970-7x110-15x130-7480 |
| 2003-07-21-2004-01-01 | ගබඩා භාරකරු i | T-2-2-2 | රා.ප.ච. 2/97 | | වාර්ෂික<br>57120-7x130-15x 1560-89760<br>මාසික<br>4970-7x110-15x130-7480 |
| 2004-01-01-2004-12-01 | ගබඩා භාරකරු i | TA-2-2-2 | රා.ප.ච. 15/2003 | | වාර්ෂික<br>7120-7x1320-8x1560 -104760<br>මාසික<br>9210-7x110-8-130-12255 |
| 2004-12-01-2006-01-01 | ගබඩා භාරකරු i | TB-2-2-2 | රා.ප.ච. 9/2004 | | 13320-10x120-7x140-12x290-12345-22760 |
| 2006-01-01-2008-07-21 | කළමණාකාර සහකාර ii | MA1-1-2006 C2 | කළ.සේවා.30 | | 13320-10x120-7x140-12x290-12x345-22760 |
| 2008-07-21-2009-01-01 | කළමණාකාර සහකාර i | MA1-1-2006 C2 | කළ.සේවා.30 | | 13450-10x145-7x170-12x290-12x345-23710 |
| 2009-01-01-2013-02-12 | කළමණාකාර සහකාර i | MA1-1-2006 A C2 | කළ.සේවා.30 (i) | | 20890-10x365-18x530-34440 |
| 2013-02-12-2016-01-01 | කළමණාකාර සහකාර අධිශ්‍රේණිය ii | JM1-2-2006 A C2 | කළ.සේවා.30 (i) | | |
| 2016-01-01-2018-02-12 | කළමණාකාර සහකාර අධිශ්‍රේණිය ii | JM1-2-2016 Grade ii C2 | කළ.සේවා. 2/16 | | |
| 2018-02-12-2023-06-01 | කළමණාකාර සහකාර අධිශ්‍රේණිය i | JM1-2-2016 Grade i C2 | කළ.සේවා. 2/16 | | |

මේ අනුව පැමිණිලිකරුට 2018.02.12 දින වන විට කළමනාකරණ සහකාර අධිශ්‍රේණිය i තනතුර ලැබිය යුතු බවත් ඊට අදාළ වැටුප් කාණ්ඩය JM1-2-2016-C2 බවත් තීරණය කරන අතර එම තීරණය සාධාරණ සහ යුක්ති සහගත බවටත් ප්‍රකාශ කරමි.

04. එම තනතුරට සහ එම වැටුප් කාණ්ඩයේ වැටුපකට පැමිණිලිකරු හිමිකම් ලබන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද?

1998.07.21 දින සිට මේ දක්වා පැමිණිලිකරු ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ගබඩා භාරකරුවෙකු ලෙසට සේවයේ යොදවා ඇති බව සාක්ෂි විභාගයේදී තහවුරු වී ඇත. තවද 2001 වර්ෂයේ සිටම මෙම ආයතනයේ සේවක උසස් කිරීමේ පටිපාටියක් ක්‍රියාත්මක වී ඇති බව ඔප්පු වී ඇත. ඒ අනුව යම් සේවකයෙකුගේ සේවා කාලය වසර 5ක් සම්පූර්ණ වූ පසු අදාළ වෙනත් සුදුසුකම් ද සපුරා ඇත්නම් ඔහුට හෝ ඇයට ඊළඟ උසස්වීම සඳහා නිවැරදි වැටුප් කාණ්ඩයේ නිවැරදි වැටුප් පරිමාණයට අදාළව සුදුසු වැටුප් තලයක පිහිටුවිය යුතුව ඇත. එසේ පැමිණිලිකරුට ලබා දිය යුතුව තිබූ තනතුරු වල ඔහු පිහිටුවීමෙන් පසුව ඒ ඒ වර්ෂයේ ඔහුට ඉපැයීමට

හැකිව තිබූ වැටුප් ගණනය කළෙමි.

අනතුරුව පැමිණිලිකරුට මේ දක්වා සැබෑ ලෙසම ලබාදී ඇති උසස්වීම් වලට අනුව ඒ ඒ වර්ෂයේ ගෙවීම් කර ඇති වැටුප් ප්‍රමාණයන් මේ දක්වා ගණනය කළෙමි.

දැන් පැමිණිලිකරුට ලබා දිය යුතුව තිබූ නමුත් ලබා නොදුන් තනතුරු නිසි පරිදි ලබා දුන්නේ යැයි උපකල්පය කර මේ දක්වා වසරින් වසර ලැබීමට නියමිතව තිබූ වැටුප් ගණනය කිරීමෙන් පසු මුළු වැටුප් මුදලේ එකතුව හා සැබෑ ලෙසම ලබන ලද උසස්වීම් වලට අනුව වසරින් වසර ලැබූ වැටුප් ගණනය කර ලබා ගන්නා ලද මුළු වැටුප් මුදලේ එකතුව අතර වෙනස ගණනය කළ යුතුව ඇත. එම වෙනසේ අගය මූල්‍යමය ප්‍රදානයක් ලෙස වගඋත්තරකාර පාර්ශ්වය විසින් පැමිණිලිකරු වෙත ගෙවීමට කටයුතු කිරීම සාධාරණ වේ.

පැමිණිලිකරුට නිසි පරිදි නියමිත දිනට උසස්වීම් ලැබුනේ නම් එම උසස්වීම්වලට අදාළ තනතුරු, උසස්වීම් ලැබිය යුතු දිනය සහ වැටුප් විස්තර.

| කාලාන්තරය | වැටුප | ගැළපුම් දීමනාව | මුළු වැටුප | තනතුර | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|
| 1998-07-21-1999-07-21 | 4760x12 | | 57120 | ගබඩා භාරකරු ii | 57120-7x1320-15x1560-89760 |
| 1999-07-21-2000-07-21 | 4870x12 | | 58440 | ගබඩා භාරකරු ii | 57120-7x1320-15x1560-89760 |
| 2000-07-21-2001-07-21 | 4980x12 | | 59760 | ගබඩා භාරකරු ii | 57120-7x1320-15x1560-89760 |
| 2001-07-21-2002-07-21 | 5090x12 | | 61080 | ගබඩා භාරකරු ii | 57120-7x1320-15x1560-89760 |
| 2002-07-21-2003-07-21 | 5200x12 | | 62400 | ගබඩා භාරකරු ii | 57120-7x1320-15x1560-89760 |
| 2003-07-21-2004-01-01 | 5890x5 | | 29450 | ගබඩා භාරකරු i (+5 වැටුප් වර්ධක) | 57120-7x1320-15x1560-89760 |
| 2004-01-01-2004-07-21 | 6010x7 | | 42070 | ගබඩා භාරකරු i | 72120-7x1320-8x1560-104760 15/2003 |
| 2004-07-21-2004-12-01 | 6120x5 | | 30600 | ගබඩා භාරකරු i | 72120-7x1320-8x1560-104760 15/2003 |
| 2004-12-01-2005-07-21 | 9260x7 | | 64820 | ගබඩා භාරකරු i | 111120-7x1320-8x1560-147060 9/2004 |
| 2005-07-21-2006-01-01 | 9370x5 | | 46850 | ගබඩා භාරකරු i | 111120-7x1320-8x1560-104760 9/2004 |
| 2006-01-01-2006-07-21 | 12345x7 | | 86415 | කළමණාකරණ සහකාර ii | 13320-10x120-7x140-12x290-12x345-22760 30,MA1-2-2006 C2 |
| 2006-07-21-2007-01-01 | 12842.50x5 | | 64212.50 | කළමණාකරණ සහකාර ii | 13320-10x120-7x140-12x290-12x345-22760 30,MA1-2-2006 C2 |
| 2007-01-01-2007-07-21 | 13151.25x7 | | 92058.75 | කළමණාකරණ සහකාර ii | 13320-10x120-7x140-12x290-12x345-22760 30,MA1-2-2006 C2 |
| 2007-07-21-2008-07-21 | 13365.62x12 | | 160387.44 | කළමණාකරණ සහකාර ii | 13320-10x120-7x140-12x290-12x345-22760 30,MAl-2-2006 C2 |
| 2008-7-21-2009-01-01 | 14280x5 | | 201400 | කළමණාකරණ සහකාර i | 13320-10x120-7x140-12x290-12x345-22760 30,MAl-2-2006 C2 |
| 2009-01-01-2009-07-21 | 14320x7 | | 100240 | කළමණාකරණ සහකාර i | 13450-10x145-7x170-12x290-12x345 30(i),MAl-2-2006A C2 |
| 2009-07-21-2010-07-21 | 19465x12 | | 235580 | කළමණාකරණ සහකාර i | 13450-10x145-7x170-12x290-12x345 30(i),MAl-2-2006A C2 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2010-07-21-2011-07-21 | 19510x12 | | 234120 | කළමණාකරණ සහකාර i | 13450-10x145-7x170-12x290-12x345 30(i),MAl-2-2006AC2 |
| 2011-07-21-2012-07-21 | 19655x12 | | 235860 | කළමණාකරණ සහකාර i | 13450-10x145-7x170-12x290-12x345 30(i),MAl-2-2006AC2 |
| 2012-07-21-2013-02-12 | 19700x8 | | 157600 | කළමණාකරණ සහකාර i | 13450-10x145-7x170-12x290-12x345 30(i),MAl-2-2006AC2 |
| 2013-02-12-2014-02-12 | 20890x12 | | 250680 | කළමණාකරණ සහකාර අධි ii | 20890-10-365-18x550-34440 30(i), JM1-2-2006 C2 |
| 2014-02-12-2015-02-12 | 21255x12 | | 255060 | කළමණාකරණ සහකාර අධි ii | 20890-10-365-18x550-34440 30(i), JM1-2-2006 C2 |
| 2015-02-12-2015-12-31 | 21620x11 | | 237820 | කළමණාකරණ සහකාර අධි ii | 20890-10-365-18x550-34440 30(i), JM1-2-2006 C2 |
| 2016-01-01-2016-02-12 | 26269x1 | 9675x1 | 35944 | කළමණාකරණ සහකාර අධි ii | 2/2016 JM1-2-2016 C2 |
| 2016-02-12-2017-02-12 | 26712x11 | 9670x11 | 950202 | කළමණාකරණ සහකාර අධි ii | 2/2016 JM1-2-2016 C2 |
| 2017-02-12-2018-02-12 | 31960x12 | 4860x12 | 441840 | කළමණාකරණ සහකාර අධි ii | 2/2016 JM1-2-2016 C2 |
| 2018-02-12-2019-02-12 | 40661x12 | | 487932 | කළමණාකරණ සහකාර අධි i | 2/2016 JM1-2-2016 C2 |
| 2019-02-12-2020-02-12 | 46991x12 | | 563892 | කළමණාකරණ සහකාර අධි i | 2/2016 JM1-2-2016 C2 |
| 2020-02-12-2021-02-12 | 53555x12 | | 642660 | කළමණාකරණ සහකාර අධි i | 2/2016 JM1-2-2016 C2 |
| 2021-02-12-2022-02-12 | 54690x12 | | 656280 | කළමණාකරණ සහකාර අධි i | 2/2016 JM1-2-2016 C2 |
| 2022-02-12-2023-02-12 | 55825x12 | | 669900 | කළමණාකරණ සහකාර අධි i | 2/2016 JM1-2-2016 C2 |
| 2023-02-12-2023-06-01 | 56960x12 | | 205056 | කළමණාකරණ සහකාර අධි i | 2/2016 JM1-2-2016 C2 |
| | | | | | |
| | එකතුව | | 8015729.69 | | |

පැමිණිලිකරුට 1998.07.01 දින සිට සැබෑ ලෙසම ලැබී ඇති තනතුරු නාම, තනතුරු ලැබී ඇති දිනයන් සහ වැටුප් විස්තර

| | | | | | |
|---|---|---|---|---|---|
| 1997.07.21-1997.08.01 | 151.33x11 | | 1664.63 | යන්ත්‍ර ශිල්පි | කොන්ත්‍රාත් පදනම යටතේ |
| 1997.08.01-1999.01.01 | 4540x5 | | 22700 | යන්ත්‍ර ශිල්පි | කොන්ත්‍රාත් පදනම යටතේ |
| 1999.01.01-2000.01.01 | 4540x12 | | 54480 | යන්ත්‍ර ශිල්පි | කොන්ත්‍රාත් පදනම යටතේ |
| 2000.01.01-2001.01.01 | 4540x12 | | 54480 | යන්ත්‍ර ශිල්පි | කොන්ත්‍රාත් පදනම යටතේ |
| 2001.01.01-2001.11.01 | 4540x10 | | 45400 | යන්ත්‍ර ශිල්පි | කොන්ත්‍රාත් පදනම යටතේ |
| 2001.11.01-2002.11.01 | 4320x12 | | 57840 | අර්ධපුහුණු ලියවන පට්ටල්කරු | 47880-14x1320-6x1560-75720 2/47,T-2-1 |
| 2002.11.01-2003.11.01 | 4430x12 | | 53160 | අර්ධපුහුණු ලියවන පට්ටල්කරු | 47880-14x1320-6x1560-75720 2/47T-2-1 |
| 2003.11.01-2004.01.01 | 4540x2 | | 9080 | අර්ධපුහුණු ලියවන පට්ටල්කරු | 47880-14x1320-6x1560-75720 2/47T-2-1 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2004.01.01-2004.11.01 | 5240x10 | | 52400 | අර්ධපුහුණු ලියවන පට්ටල්කරු | 62880-14x1320-6x1560-90720 15/2003,TA-2-1 |
| 2004.11.01-2004.12.01 | 5350x1 | | 5350 | අර්ධපුහුණු ලියවන පට්ටල්කරු | 62880-14x1320-6x1560-90720 15/2003,TA-2-1 |
| 2004.12.01-2005.11.01 | 8490x1 | | 93390 | අර්ධපුහුණු ලියවන පට්ටල්කරු | 101880-14x1320-6x1560-129720 9/2004, TA-2-1 |
| 2005.11.01-2006.01.01 | 8600x2 | | 17200 | අර්ධපුහුණු ලියවන පට්ටල්කරු | 101880-14x1320-6x1560-129720 9/2004, TA-2-1 |
| 2006.01.01-2006.11.01 | 8600x10 | | 86000 | අර්ධපුහුණු ලියවන පට්ටල්කරු | 101880-14x1320-6x1560-129720 9/2004, TA-2-1 |
| 2006.11.01-2007.11.01 | 13320x12 | | 159840 | ගබඩා භාරකරු ii | 13320-10x120-7x140-12x290-12x315-22760 30;MAl-2-2006 A C2 |
| 2007.11.01-2008.11.01 | 13465x12 | | 161580 | ගබඩා භාරකරු ii | 13320-10x120-7x140-12x290-12x315-22760 30;MAl-2-2006 A C2 |
| 2008.11.01-2009.01.01 | 13755x2 | | 27510 | ගබඩා භාරකරු ii | 13320-10x120-7x140-12x290-12x315-22760 30;MAl-2-2006 A C2 |
| 2009.01.01-2009.11.01 | 13885x10 | | 138850 | ගබඩා භාරකරු ii | 13450-10x145-7x170-12x290-12x345-23710 30(i) MA1-2-2006 A C2 |
| 2009.11.01-2010.11.01 | 14030x12 | | 168360 | ගබඩා භාරකරු ii | 13450-10x145-7x170-12x290-12x345-23710 30(i) MA1-2-2006 A C2 |
| 2010.11.01-2011.11.01 | 14175x12 | | 170100 | ගබඩා භාරකරු ii | 13450-10x145-7x170-12x290-12x345-23710 30(i) MA1-2-2006 A C2 |
| 2011.11.01-2012.11.01 | 17540x12 | | 210480 | ගබඩා භාරකරු i | 13450-10x145-7x170-12x290-12x345-23710 30 (i) MA1-1-2006 A C2 |
| 2012.11.01-2013.11.01 | 17830x12 | | 213960 | ගබඩා භාරකරු i | 13450-10x145-7x170-12x290-12x345-23710 30(i) MA1-1-2006 A C2 |
| 2013.11.01-2014.11.01 | 18120x12 | | 217440 | ගබඩා භාරකරු i | 13450-10x145-7x170-12x290-12x345-23710 30(i) MA1-1-2006 A C2 |
| 2014.11.01-2015.11.01 | 18410x12 | | 220920 | ගබඩා භාරකරු i | 13450-10x145-7x170-12x290-12x345-23710 30(i) MA1-1-2006 A C2 |
| 2015.11.01-2016.1.01 | 18700x2 | | 37400 | ගබඩා භාරකරු i | 13450-10x145-7x170-12x290-12x345-23710 30(i) MA1-1-2006 A C2 |
| 2016.01.01-2016.11.01 | 22712x10 | 9728x10 | 319400 | ගබඩා භාරකරු i | 2/2016 |
| 2016.11.01-2017.11.01 | 23064x12 | 9724x12 | 393456 | ගබඩා භාරකරු i | 2/2016 |
| 2017.11.01-2018.11.01 | 27552x12 | 5584x12 | 397632 | ගබඩා භාරකරු i | 2/2016 |
| 2018.11.01-2019.11.01 | 32164x12 | 1320x12 | 401808 | ගබඩා භාරකරු i | 2/2016 |
| 2019.11.01-2020.11.01 | 36999x12 | | 443988 | ගබඩා භාරකරු i | 2/2016 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2020.11.01-2021.11.01 | 41980x12 | | 503760 | ගබඩා භාරකරු i | 2/2016 |
| 2021.11.01-2022.11.01 | 42690x12 | | 512280 | ගබඩා භාරකරු i | 2/2016 |
| 2022.11.01-2023.01.01 | 43400x7 | | 303800 | ගබඩා භාරකරු i | 2/2016 |
| | | | | | |
| | එකතුව | | 5549708.63 | | |

2006.11.01 දින ගබඩාභාරකරු ii ශ්‍රේණියට උසස්වීමෙන් අනතුරුව 2011.11.01 දින ගබඩාභාරකරු i ශ්‍රේණියට උසස්වීමක් ලබා ඇති අතර එම තනතුරු දෙක අතර වැටුපේ වෙනස එකම වැටුප් පරිමාණයේ වැටුප් වර්ධක 6කි.

එබැවින් 1998.7.21 වන දින ගබඩාභාරකරු ii ශ්‍රේණියද 2003.07.21 වන දින ගබඩාභාරකරු i ශ්‍රේණියද ලැබිය යුතුව තිබූ බැවින් එම තනතුරු දෙකෙහි වැටුප් අතර වෙනසද වැටුප් වර්ධක 5ක් හෝ 6ක් ලෙස සැළකීම සාධාරණ වනු ඇත. එම වෙනස වැටුප් වර්ධක 5ක් ලෙස සළකා ගණනය කිරීම් කළෙමි.

ඒ අනුව කළමනාකරණ සහකාර ii ශ්‍රේණිය හා කළමනාකරණ සහකාර i ශ්‍රේණියට අදාළ වැටුප් අතර වෙනසද වැටුප් වර්ධක 5ක් ලෙස සලකා ගණනය කිරීම් කළෙමි.

### ප්‍රදානය

1. ජේ.එම්.සිසිර සමන් කුමාර යන අය 1998.07.21 දින සිට මේ දක්වා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් ගබඩාභාරකරුවෙකු ලෙස සේවයේ යොදවා ඇති බව සනාථ වී ඇති බැවින් මුල් පත්වීමේ සිට එනම් 1998.07.21 සිට ඔහුට ලැබිය යුතු තනතුරු ලෙසට,

I. 1998.07.01 දින සිට ගබඩාභාරකරු ii ශ්‍රේණියේ පිහිටුවීමටත්

II. 2003.07.01 දින සිට ගබඩාභාරකරු i ශ්‍රේණියේ පිහිටුවීමටත්

III. 2008.07.01 දින සිට කළමනාකරණ සහකාර i ශ්‍රේණියේ පිහිටුවීමටත්

IV. 2013.02.12 දින සිට කළමනාකරණ සහකාර අධි ii ශ්‍රේණියෙහි පිහිටුවීමටත් වැටුප් කාණ්ඩය ලෙස JM1-2-2006A,C2 වැටුප් කාණ්ඩය ලබා දීමටත්,

V. 2018.02.12 දින සිට කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියෙහි i පිහිටුවීමටත් වැටුප් කාණ්ඩය ලෙස JM1-2-2016 වැටුප් කාණ්ඩය ලබා දීමටත්,

නියම කරමි. පැමිණිලිකරු මෙම තනතුරුවල පිහිටුවීම මෙම ප්‍රදානය ගැසට් ගත වී මසකට පෙර නිමකර සහකාර කම්කරු කොමසාරිස් උතුරු කොළඹ වෙත ලිඛිතව දැන්විය යුතුය.

1998.07.01 දින සිට 2023.06.01 දින දක්වා වගඋත්තරකාර පාර්ශ්වය විසින් හිඟ වැටුප් ගණනය කිරීමක් මේ සඳහා නොකළ යුතුය.

2. වගඋත්තරකාර ආයතනය වන ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් 1998.07.01 දින සිට 2023.06.01 දින දක්වා සැබෑ ලෙසම පැමිණිලිකරුට ගෙවා ඇති වැටුප් මුදල්වල සම්පූර්ණ එකතුව හා 1998.07.01 දින සිට 2023.06.01 දින දක්වා ආයතනයේ පවත්වාගෙන ගොස් ඇති සේවක උසස් කිරීමේ පටිපාටියට අනුව නියමිත දිනට නිසි පරිදි කළ යුතුව තිබූ ජේ.එම්.සිසිර සමන් කුමාර යන අය වෙනුවෙන් වූ උසස්කිරීම් කළේ නම් පැමිණිලිකරුට ලැබිය යුතුව තිබූ වැටුප් මුදල්වල සම්පූර්ණ එකතුව අතර වෙනසට ආසන්න වශයෙන් සමාන වූ රුපියල් 2466021.06 (රුපියල් විසිහතර ලක්ෂ හැට හයදහස් විසිඑකයි ශත හය) ක මුදල මූල්‍ය ප්‍රදානයක් වශයෙන් ජේ.එම්.සිසිර සමන් කුමාර වෙත ගෙවීම පිණිස මෙය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත හෝ එදිනට පෙර උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් තැන්පත් කළ යුතු බවට නියෝග කරමි.

මෙම මුළු මුදල හෝ ඉන් කොටසක් හෝ මේ වන විටත් පැමිණිලිකරු වෙත ගෙවා ඇත්නම් එසේ ගෙවා ඇති බවට වගඋත්තරකාර පාර්ශ්වය විසින් ලේඛන මගින් උතුරු කොළඹ සහකාර කම්කරු කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි තහවුරු කළයුතු අතර අදාළ මුදල් පැමිණිලිකරුට ලැබී ඇති බවට උතුරු කොළඹ සහකාර කම්කරු කොමසාරිස්වරයා විසින් තහවුරු කරගත යුතුය.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

එම්.එම්.අයි.ආර්.ඒ.ජයතිලක.
බේරුම්කරු,

2023 සැප්තැම්බර් මස 06 වැනි දින.

EOG 10-0107

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.